# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 44 — 1973 ජනවාරි 26 වැනි සිකුරාද — 1973.01.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම — — — | 101 | ආණ්ඩුවේ නොවන දැන්වීම් — — — | 121 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම — — | 118 | රථ බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් — — | — |
| බඩු බාහිරාදිය විකිණීම — — — | 118 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම — — | — |
| කොටුපල් ටෙන්ඩ හා වෙනත් ටෙන්ඩ විකිණීම — — | — | විවිධ දැන්වීම — — — | — |


# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පාවිච්චි කළ කාර්යාලීය උපකරණ විකිණීම

පහත දක්වා තිබෙන පාවිච්චියට නුසුදුසු බව තීරණය කරන ලද කාර්යාලීය උපකරණ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අංක 16/7 පිහිටි ශාඛා කාර්යාලයෙන් මිලදී ගෙන එම ස්ථානයෙන් ඒවා ඉවත් කර ගැනීම පිණිස 1973 පෙබරවාරි 28 දින ප. ව. 2.00 වන තෙක් මවිසින් ටෙන්ඩර් පත් බාරගනු ලැබේ.

විස්තර

| | | | | |
|---|---|---|---|---|
| 1. | අත් ගණිත යන්ත්‍රය ඔඩිනර් | ... | අංක 107—602069 | |
| 2. | එකතු කිරීමේ යන්ත්‍රය මොන්රෝ | ... | ,, | 364499 |
| 3. | අන්ඩර්වුඩ සන්ස්ට්‍රෑන්ඩ ගණිත යන්ත්‍රය | ... | ,, | 482431 |
| 4. | ,, ,, ,, ,, | ... | ,, | 482432 |
| 5. | ,, ,, ,, ,, | ... | ,, | 482437 |
| 6. | අන්ඩර්වුඩ සන්ට්‍රෑන්ඩ ගණිත යන්ත්‍රය | ... | අංක 107 | 482426 |
| 7. | ,, ,, ,, ,, | ... | ,, | 550580 |
| 8. | ඇඩෝඇක්ස් එකතු කිරීමේ ගණිත යන්ත්‍ර | ... | ,, | 37900 |
| 9. | ඇඩෝඇක්ස් විදුලි බල ගණිත යන්ත්‍ර | ... | ,, | 88233 |
| 10. | ඔලිවෙට්ටි ඩිවිසුමා ගණිත යන්ත්‍ර | ... | ,, | 841223 |
| 11. | ඔලිවෙට්ටි ඩිවිසුමා ගණිත යන්ත්‍ර | ... | ,, | 841227 |
| 12. | රෙමින්ටන් රෑන්ඩ ප්‍රිංටින් විදුලිබල යන්ත්‍ර | ... | ,, 96— | 683704 |
| 13. | එම | ... | ,, 98— | 1304088 |
| 14. | ඉංග්‍රීසි ඉම්පිරියල් යතුරු ලියනය | ... | ,, | 347908 |
| 15. | එම | ... | 117610—(එෆ්.2120) | |
| 16. | විදුලි බලයෙන් ක්‍රියාකරන මෝටර් (අශ්වබල 1/4) (පාවිච්චිකළ හැක) | ... | 18 යි | |

## සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

17. පරණ ප්‍රවෘත්ති පත්‍ර භාණ්ඩර ... 3 යි.

ඉහත සඳහන් භාණ්ඩ අංක 16/7 ඇල්බට් චන්ද්‍රවංශයේ පිහිටි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගබඩාවේ දී සාමාන්‍ය වැඩකරන වේලාවන් තුළ පරීක්ෂා කළ හැකිවේ.

පසුව ආපසු ගෙවනු ලබන රු. 5 ක තැන්පත් මුදලක් තබන අයවලුන්ට ජනලේඛන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි තැන විසින් 1973 පෙබරවාරි 27 වැනි දින පෙ.ව. 10.00 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

වැඩිමනත් විස්තර ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අංක 16/7, ඇල්බට් චන්ද්‍රවංශයේ පිහිටි ශාඛා කාර්යාලයෙන් ලබාගත හැක.

එල්. බී. රාජකරුණා,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ

1972 දෙසැම්බර් මස 30 දින,
කොළඹ 7, තැ. පෙ. 563,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දීය.

1—852—73.01.26 වැනි දින අංක 44 දරන ගැසට් පත්‍රය

---

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### රාගම මහර බන්ධනාගාරයේ ඇති නිෂ්පාදිත ලනු අඟුරු මලු සහ පලුදු තිස් ගෝනි ආදිය විකිණීම

පහත සඳහන් ද්‍රව්‍යයන් මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් 1973 පෙබරවාරි මස 20 වෙනි දින උදේ 10.30 දක්වා මහර බන්ධනාගාරයේ අධිකාරී විසින් භාරගනු ලැබේ.

(අ) නිෂ්පාදනය කරන ලද ලනු අඟුරු මලු ... 2490
(ආ) පලුදු වූ තිස් ගෝනි ... ... 1000

2. ටෙන්ඩර් සඳහා රුපියල් 25 ක මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. එයට ලබා ගන්නා රිසිට් පත ටෙන්ඩර් පත්‍රය සමග ආපසු (අමුනා) එවිය යුතුයි. තමාගේ ටෙන්ඩරය භාරගත් බව ලිපියකින් දන්වන ලදුව දින 7 ක් ඇතුළත නියම මිල ගණන් ගෙවා ඉහත සඳහන් බඩු ගෙනයාමට නොහැකි වන හෝ අකමැත්ත දක්වන අයගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරනු ලැබේ. ටෙන්ඩරය භාරගත් බව දන්වන ලද ලිපිය ටෙන්ඩර්කරු විසින් දී තිබෙන ලිපිනයට තැපැල් කළහොත් හෝ ගෙනැවිත් දුනහොත් එය ඔහුට ලැබුන බවට සලකනු ලැබේ. භාර ගත් ටෙන්ඩර්කරු විසින් ඒ බඩු ගෙනයාමෙන් පසුව ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර්කරු විසින් 'අ' කොටස සඳහා වෙනම ඒකාබද්ධ මිලක් ද, 'ආ' කොටස සඳහා වෙනම ඒකාබද්ධ මිලක් ද, වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය. "තිස් ගෝනි ආදිය මිලදී ගැනීම" යනුවෙන් කවරයේ වම් කෙළවරේ මුදුනේ සඳහන් කළ යුතුය. සීල් තබන ලද ටෙන්ඩර් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මේ සඳහා මුද්‍රිත පෝරම නැත.

4. මහර බන්ධනාගාර අධිකාරී තුමාගේ කාර්යාලයේදී 1973 පෙබරවාරි මස 20 වෙනි දින උදේ 10.35 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටීමට පුළුවන.

5. මේ සඳහා වැඩි විස්තර අවශ්‍ය නම් පහත සඳහන් අයගෙන් ලබා ගත හැක.

සී. ඊ. ජැන්ස්,
අධිකාරී, මහර බන්ධනාගාරය.

මහර රාගම බන්ධනාගාරය,
73. 01. 05 දින.

1–851—73.01.26 වැනි දින අංක 44 දරන ගැසට් පත්‍රය.

---

### රාජ්‍ය දැව සංස්ථාව

### රෝඩ් රෝලර් යන්ත්‍රයක් විකිණීම

පිච්යර් වර්ගයේ ටොන් වායුව ටයර රෝලරය විකිණීම සඳහා 1973. 02. 09 වැනි දින දහවල් 12.00 දක්වා සීල් තබන ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයට මෙම සංස්ථාවට අයත් කල්දෙමුල්ල කාර්මික වැඩපලේ තබා ඇති මෙම රෝලරය එම වැඩපල භාර නිලධාරී මහතාගේ අවසරය ඇතිව කාර්යාලය වේලාවන් තුළදී බැලිය හැක.

නැවත ගෙවනු ලබන රුපියල් සියයක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා ටෙන්ඩර් ගාස්තු වශයෙන් නැවත නොගෙවනු ලබන රුපියල් දහයක මුදලක් තැන්පත් කර ක්‍රියාකාරී කළමනාකරුගේ කාර්යාලය වෙතින් ටෙන්ඩර් ආකෘති පත්‍ර හා කොන්දේසි ලබාගත හැක.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ 1973. 02. 08 වැනි දින ප. ව. 2.00 දක්වා පමණි. වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී කළමනාකාර වෙතින් ලබාගත හැක.

ඩබ්. ආර්. එච්. පෙරේරා,
සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව.

7, වජිර පටුමග,
කොළඹ 5.

1–990—73.01.26 වැනි දින අංක 44 දරන ගැසට් පත්‍රය.

---

### ආහාර දෙපාර්තමේන්තුව

### ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි හා රෙදි උර

කොළඹ චාමස් ධාන්‍යාගාරයේ තිබෙන 1,00,158 ක් පමණ වූ ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි හා රෙදි උර මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1973 පෙබරවාරි මස 13 වෙනි අඟහරුවාදා සවස 2.00 දක්වා අංක 330, යූනියන් පෙදෙසේ ආහාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

රු. 500 ක් තැන්පත් කිරීමෙන් පසුව මෙම කාර්යාලයෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. ටෙන්ඩර් පිළිබඳ විස්තර වාර්තාවක් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කළ විට ලබාගත හැකි වේ.

ආර්. කාතාමුත්තු,
ආහාර කොමසාරිස් වෙනුවට.

1973. 01. 15 දින,
කොළඹ, 330, යූනියන් පෙදෙසේදීය.

1–948—73.01.26 වැනි දින අංක 44 දරන ගැසට් පත්‍රය.

---

### ප්‍රවාහන සේවාවන් සඳහා ටෙන්ඩර් කැඳවීම

1973 පෙබරවාරි මස 09 දින පෙරවරු 10.30 දක්වා මෙම සංස්ථාවේ ප්‍රවාහන සේවාවන් සඳහා ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ. රු. 100.00 ක ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම කොළ මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් 1973 පෙබරවාරි මස 08 දින දහවල් 12.00 න් පසු භාර ගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රු. 10.00 ක් ගෙවීමෙන් ලබා ගත හැක.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර,
කොළඹ 5.

1–984—73.01.26 වැනි දින අංක 44 දරන ගැසට් පත්‍රය

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවාව—කළුතර කොටස

කළුතර කොටසේ පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් 1973.02.20 දින අඟහරුවාද පෙ.ව. 10.00 දක්වා කොළඹ 7, කොනිස්ටන් පෙදෙස, බටහිර දිසා වැඩ අධ්‍යක්ෂ විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීම එදිනම පෙ.ව 11.00 ට සිදු කෙරේ.

| වැඩෙහි නම | කොන්ත්‍රාත් කරු ලියා පදිංචි මුදල රු. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|
| මහවෙල් යායේ නාගහදූව පාලමේ සිට දුම්මල මෝදර ඇල දක්වා වූ ජල පවහන ඇල බෑවුම් අනුපාතය නැවත සකස්කර ප්‍රතිසංස්කරණය කිරීම ... ... ... | 75,000 0... | 100 0 |

2. ඉහත දක්වා ඇති මුදල් ප්‍රමාණයන් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා රජයේ දෙපාර්තමේන්තුවල ලියා පදිංචි ඇති කොන්ත්‍රාත්කරුවන්ට, සමිති, සමාගම්වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

3 1973 පෙබරවාරි මස 5 වෙනි දින සිට පෙබරවාරි මස 15 දින දහවල් 12.00 දක්වා (මෙම දෙදින ද ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී කළුතර/අගලවත්ත/මොරටුව හෝමාගම/පානදුර හොරණ බුලත්සිංහල විධායක ඉංජිනේරු කාර්යාල වලින් ලබා ගත හැකි ටෙන්ඩර් ෆෝරම පල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝරම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද ? නැත්ද ? යන්න සලකා බැලීම සඳහා ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ සහ එම වැඩ වල වටිනාකම දක්වෙන ප්‍රකාශයක් විධායක ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ෆෝරම නිකුත් කිරීමට පෙර, එම වැඩ සඳහා ඉහත දැක්වෙන අයුරු ටෙන්ඩර් තැන්පත් මුදල් එකී විධායක ඉංජිනේරු කාර්යාලවල තැන්පත් කළ යුතුයි.

4. මෙම වැඩය පිළිබඳ සැලසුම් සහ වෙනත් සියලු විස්තර කාර්යාල වේලාවන් තුලදී කළුතර විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. ඩී. පී. සමරසේකර,
විධායක ඉංජිනේරු, කළුතර.

1–905—73.01.26 වැනි දින අංක 44 දරන ගැසට පත්‍රය

---

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ඉවතලන බැනියන් සහ කඳුරෙදි කෑලි සැපයීම සඳහා ටෙන්ඩර්පත්

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඉහත සඳහන් දේවල් සැපයීම සඳහා සිල් තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ආපසු ලබාගත හැකි රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා ගබඩා හා සැපයීම් කළමනාකාරගෙන් ටෙන්ඩර් කොන්දේසි ලබා ගත හැකිය.

1973 පෙබරවාරි 06 දින පෙ. ව. 10.00 තෙක් ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

නො. 113, ගාලු පාර,
කොළඹ 3.

1–993—73.01.26 වැනි දින අංක 44 දරන ගැසට් පත්‍රය.

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

රජයේ ගොවිපලවලට පැලකිරීම සඳහා ඇට ගැනීමට සුදුසු ඉදුනු වල් සහ කොහුඅඹ ගෙඩි සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර්

පහත සඳහන් ගොවිපලවලට ඉහත සඳහන් දේ සැපයීම සඳහා සිල් තබන ලද ටෙන්ඩර් පත් 1973 ජනවාරි මස 31 දින දවල් 12 දක්වා කොළඹ ගොවිපල් පාලන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ :—

| | | |
|---|---|---|
| (අ) | අඹේපුස්ස රජයේ ගොවිපලට | අඹගෙඩි 60,000 |
| (ආ) | වල්පිට රජයේ ගොවිපලට | අඹගෙඩි 100,000 |
| (ඇ) | හොරණ රජයේ ගොවිපලට | අඹගෙඩි 40,000 |
| (ඈ) | කරපිංච රජයේ ගොවිපලට | අඹගෙඩි 30,000 |
| (ඉ) | පස්යාල රජයේ ගොවිපලට | අඹගෙඩි 5.000 |
| (ඊ) | බණ්ඩාරගම රජයේ ගොවිපලට | අඹගෙඩි 10,000 |

2. සපයන සෑම අඹ ගෙඩියක්ම පැලකිරීම සඳහා ඇට ගැනීමට සුදුසු ඉදුනු අඹ විය යුතු අතර ඒවා වල් අඹ සහ කොහු අඹවලින් යුක්ත විය යුතුය. ඉහත සඳහන් ගොවිපලවලට අඹගෙඩි සැපයීම සහ ගෙනැවිත් භාරදීම 1974 ජනවාරි මස 31 දිනට හෝ ඊට පෙර අවසන් කල යුතුය.

3. අඹගෙඩි සැපයීම සහ ගෙනැවිත් භාරදීම වාර 4 න් නිමකල යුතු අතර අඩු වශයෙන් එක් වරකට ඒ ඒ ගොවිපලට අවශ්‍ය අඹ ගෙඩි ප්‍රමාණයෙන් හතරෙන් පංගුවක්වත් විය යුතුය.

4. ඉහත සඳහන් 1 වෙනි ඡේදයේ (අ, සිට (ඊ, දක්වා වූ ගොවිපලවල අවශ්‍ය අඹගෙඩි ප්‍රමාණය සඳහා ටෙන්ඩර් කරුවන් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කලයුතු අතර එකී ටෙන්ඩර් පත්‍ර උදෙසා රු. 10 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ "කෘෂිකර්ම අධ්‍යක්ෂ" ටෙන්ඩර් තැන්පත් කියා තැන්පත් කර එම කුවිතාන්සිය මා වෙත ඉදිරිපත් කලවිට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. එම ටෙන්ඩර් ආකෘති පත්‍ර සම්පූර්ණ කොට කවරයක බහා ලියාපදිංචි කල තැපැලෙන් "ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලය, තැ. පෙ. 622, පළතුරු කම්හල පාර, කොළඹ 5" යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් ඒවා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුය. එවනු ලබන කවරයේ වම් කෙලවරේ මුදුනේ "රජයේ ගොවිපලවලට ඉදුනු අඹගෙඩි සැපයීමේ ටෙන්ඩර්" යන්න සඳහන් කල යුතුය.

6. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ඉල්ලුම්කරුවන්ටද පැමිණ සිටිය හැකිය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්) සමග ගිවිසුමකට ඇතුලත් විය යුතු අතර, ඒ සඳහා මුද්දර ගාස්තු තමන් විසින්ම දැරිය යුතුය.

8. එකී ගිවිසුම් අත්සන් කිරීමට පෙරාතුව තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් කොන්ත්‍රාත්තුව නිසියාකාර ගෙනයාම සඳහා රු. 250 ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් ඕනෑම කච්චේරියක තැන්පත් කර එම කුවිතාන්සිය මා වෙත ඉදිරිපත් කල යුතුය.

9. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ හා ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටස් පමණක් පිළිගැනීමේ අවසාන බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුවේ.

10. වැඩිමනත් විස්තර කොළඹ 5. පළතුරු කම්හල පාර, තැ. පෙ. 622, ස්ථානයේ පිහිටි මෙම කාර්යාලයෙන් දැනගත හැකිය.

එස්. තවරාජවේල්,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති (ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය) කොළඹ.

1973 01. 01 දින,
පළතුරු කම්හල පාර. තැ. පෙ. 622,
ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේදීය.

1–856—73.01.26 වැනි දින අංක 44 දරන ගැසට් පත්‍රය

### සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුව

කුරුණෑගල කැඳ දැමීමේ ආයතනයේ ළිඳක් කැනීම සඳහා, කොළඹ, ගෝමාස් ගොඩනැගිල්ල, සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 2. 20 දින පෙ. ව. 10.00 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 15,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියා පදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට මෙයට සහභාගි විය හැකි ය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමැති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 25.00 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973. 2. 19 දින පෙ. ව. 12.00 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණසීර,
සුළු කර්මාන්ත අධ්‍යක්ෂ

යොමුව : 3/1 (1/38)
සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුව,
ගෝමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973. 1. 10/15.

1–959—73.01.26 දින අංක 44 දරන ගැසට් පත්‍රය

---

### මධ්‍යම දිසාවේ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ මහනුවර දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 වර්ෂය සඳහා ප්‍රවාහන රථවාහන/ යන්ත්‍ර හා කාර්මික යන්ත්‍රෝපකරණ කුලියට ගැනීමේ ගාස්තු ප්‍රමාණයන් නිගමනය කිරීම සඳහා ලාංකිකයන් හා ලාංකික වූ වෙළඳ සමාගම්වලින් ටෙන්ඩර් පත් මෙසේ භාරගනු ලැබේ :—

(1) ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි සම්පූර්ණ දිසාව සඳහා ගාස්තු ප්‍රමාණයන් සඳහන් කිරීම.

(2) මිනිපේ, කුණ්ඩසාලේ, මහනුවර, කඩුගන්නාව, ගලගෙදර, මාතලේ, ලග්ගල, දඹුල්ල, රත්තොට, ගම්පොල, නෝර්වුඩ්, කොත්මලේ, නුවරඑළිය, වලපනේ හා හඟුරන්කෙත ආදී කොට්ඨාශයන් සඳහා වෙන් වෙන්ව මිල ගණන් සඳහන් කිරීම.

2. මේ සඳහා 1973. 2. 26 දින පෙ. ව. 10.00 දක්වා සීල් තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලබන අතර එදිනම ඒවා විවෘත කරනු ලැබේ.

3. මේ ටෙන්ඩරය පිළිබඳ කොන්දේසි ආදිය 1973. 2. 25 දින දක්වා කුණ්ඩසාලේ පිහිටි දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේදී බලාගැනීමට අයදුම්කරුවන්ට හැකි වන අතර ටෙන්ඩර් පත් නිකුත් කිරීමේ අන්තිම දිනය 1973. 2. 25 දින වේ. ටෙන්ඩර් පතක් ලබාගැනීමට කැමති අයදුම්කරුවන් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් සඳහා රු. 25/ ගාස්තුවක් ගෙවිය යුතුය.

සී. වී. ඉ. රෝසා,
මධ්‍යම දිසාවේ වැඩ අධ්‍යක්ෂ.

කුණ්ඩසාලේ.

1–844/1—73.01.26 දින අංක 44 දරන ගැසට් පත්‍රය

---

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ මධ්‍යම දිසා කාර්යාලය, කුණ්ඩසාලේ

මධ්‍යම දිසාවේ පහත සඳහන් විධායක ඉංජිනේරු කාර්යාලයන්හි 1973 මුදල් වර්ෂය තුල ගබඩා ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් පත් කුණ්ඩසාලේ දිසාවැඩ අධ්‍යක්ෂ හා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 පෙබරවාරි 26 දින පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ. රු. 25,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්, ග්‍රාමසංවර්ධන සමිති හා සමූපකාර සමිති වලට මේ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කල හැක :—

(1) මාතලේ විධායක ඉංජිනේරු කාර්යාලය.

(2) රත්තොට විධායක ඉංජිනේරු කාර්යාලය.

ටෙන්ඩර් කරුවෙකුට යටත් පිරිසෙයින් ප්‍රවාහන ලොරි දෙකක් වත් තිබිය යුතු අතර එම වාහන තමාගේ නමින් ලියාපදිංචි කර ඇති බවට 1973 ලියාපදිංචි පත්‍රය ඉදිරිපත් කල යුතුය. එවැනි සාධක ඉදිරිපත් කල පසු පමණක් දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ටෙන්ඩර් පත් ලබාගැනීමට හැකිවනු ඇත.

කොන්ත්‍රාත් කරුවෙකුට ප්‍රාදේශීය කාර්යාල දෙකටම ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට හැකිවන අතර එක් ප්‍රාදේශීය කාර්යාලයක් සඳහා ලොරි දෙකක් යෙදවීමට හැකියාවක් තිබිය යුතුය.

මේ සඳහා ටෙන්ඩර් පත් ඉල්ලුම් කිරීමේදී දැනට තමා නිරතව සිටින රජයේ වැඩ පිළිබඳ විස්තර හා ඒ ඒ ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතික පත් පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයට ඉදිරිපත් කල යුතු වන්නේ ය. ටෙන්ඩර් පත් නිකුත් කිරීමේ අවසාන දිනය 1973 පෙබරවාරි 25 දින ප. ව. 3.00 වන අතර කච්චේරියක, දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයක හෝ මෙම කාර්යාලයේ රු. 25 ක් තැන්පත් කර මේ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතු වන්නේ ය. වෙනත් විස්තර මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කල විට ලබාගත හැක.

සී. වී. ඉ. රෝසා,
මධ්‍යම දිසාවේ වැඩ අධ්‍යක්ෂ හා
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති.

1–844/2—73.01.26 දින අංක 44 දරන ගැසට් පත්‍රය

---

### තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

#### ජෙනරේටර් යන්ත්‍රයක් විකිණීම

මරදානේ තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවෙහි තබා ඇති, ජෙනරේටර් යන්ත්‍රය විකිණීම සඳහා, කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ, පස්වන මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේ ගැණුම්පත් මණ්ඩල සභාපති විසින් 1973 පෙබරවාරි මස 22 වෙනි දින පෙරවරු 10.00 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ, පස්වන මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝර්ම වලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත් ඉදිරිපත් කල යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමට ද, අවශ්‍ය විස්තර දැන ගැනීමටද සුළුවෙන [illegible] මරදානේ තැපැල් සහ විදුලි සංදේශ [illegible] සමූව් ජෙනරේටර් යන්ත්‍රය පරීක්ෂා කර බැලීමට පිළිවෙල යොදා ගත හැකිය.

3. තැපැල් කාර්යාලයක හෝ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1973 පෙබරවාරි මස 19 දින දවල් 12 වන තෙක් බලාපොරොත්තු ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබා ගත හැකිය.

එච්. බී. එස්. ඒ. ගුණවර්ධන,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
ලෝටස් පාර,
තැ. පෙ. 503, කොළඹ 1.

1–047—73.01.26 දින අංක 44 දරන ගැසට් පත්‍රය

කෙසේ වෙතත්, මින් පසුව අඩංගු වන කිසියම් කාර්යයක් සඳහා වූ විධිවිධානයන් යටතේ මේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට සුරාබදු කොමසාරිස්ට ඇති අයිතියට මේ විධි විධානයෙන් හානියක් නොවන්නේ ය.

**20. අන් තැනෙක විධිවිධාන සලසා නැති කඩකිරීම් සඳහා වන්දි මුදල්.**—මෙහි විශේෂයෙන් වන්දියක් අයකර ගැනීමට සලසා නැති අවස්ථාවක හෝ අලාභයක් ප්‍රමාණය සුරාබදු කොමසාරිස්ගේ අභිමතය පරිදි නියම් වන විට මේ කොන්ත්‍රාත්තුවේ ඕනෑම කොන්දේසියක් කඩ කිරීම වෙනුවෙන් සුරාබදු කොමසාරිස් විසින් නියම් කළහැකි වූ ද රුපියල් දහය (රු. 10) නොඉක්මවූ ද වන්දි මුදලක් ගෙවීමට ටෙන්ඩර්කරු යටත් වන්නේ ය.

**21. ගෙවීම්වලින් දඩ අයකරගත හැකි බව.**—මේ කොන්දේසිවල අඩංගු කිසියම් විධිවිධානයන් යටතේ කිසියම් අලාභයක් සිදුවූවිට, එවිට ගෙවීමට ඇත්තා වූ හෝ ඉන් පසුව මේ ටෙන්ඩර්කරුට මේ ටෙන්ඩරය යටතේ ගෙවීමට සිදුවනනාවූ හෝ ඕනෑම මුදලකින් එවැනි වන්දි මුදල් ප්‍රමාණයක් සුරාබදු කොමසාරිස් විසින රඳවා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

**22. ගෙවීම් සතිපතා කළයුතු බව.**—පියවීම සඳහා නිවැරදි ගාස්තු ඉල්ලුම් පත්‍රයක්, ප්‍රධාන සුරාබදු කාර්යලායට ඉදිරිපත් කළ හෝ ලැබුණු දිනට පසු දිනට වැඩ කරන සම්පූර්ණ දින තුනකට නොඅඩු වූ හෝ වැඩ කරන සම්පූර්ණ දින 10 කට නොවැඩිවූ දින ගණනකදී ටෙන්ඩර් කරනු ලැබූ මිළ ප්‍රමාණයන්ට අනුව සෑම සතියකදීම ඉටු කළ සේවාවන් වෙනුවෙන් ටෙන්ඩර්කරුට ගෙවිය යුතු මුදල් සුරාබදු කොමසාරිස් විසින් ගෙවනවා ඇත. ටෙන්ඩර්කරු ඔහුගේ සතිපතා බිල් පත්‍රය ඊළඟ සතියේ වැඩ කරන තුන්වැනි දින හෝ ඊට පෙර හෝ සුරාබදු ගුදම් අධිකාරී වෙත දෙපිටපතකින් යුක්තව ඉදිරිපත් කළයුතු වන්නේ ය.

**23. කොමසාරිස් සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුළත්විය යුතු බව.**—තමාගේ ටෙන්ඩරය භාරගැනීම දැන්වූ දින 14 ක් ඇතුලත පිළිගත් ටෙන්ඩර්කරු ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් ක්‍රියා කරන්නාවූ සුරාබදු කොමසාරිස් සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුළත් විය යුතු අතර සුරාබදු කොමසාරිස් යන පදවි නාමයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ එවකට දරන්නා වූ නිලධාරියා ද ඔහුගේ එම නිලයෙහි අනුප්‍රාප්තිකයා ද අදහස් කරනු ලබන්නේ ය. පිළිගත් ටෙන්ඩර්කරු මෙහි පහත දැක්වෙන 28 වෙනි වගන්තියෙහි දැක්වෙන අවශ්‍යතාව යන්ද මේ හා එක් වරම ඉටුකළ යුතු වන්නේ ය.

**24. ඇප තැන්පත් මුදල.**—(අ) 27 වැනි කොන්දේසිය ප්‍රකාර කොන්ත්‍රාත්තුවකට ඇතුළත්වීමට පෙර පිළිගත් ටෙන්ඩර්කරු සුරාබදු කොමසාරිස් වෙත රුපියල් එක් දහසක් (රු. 1,000) ක් මුදලින් තැන්පත් කොට ඒ පිළිබඳ කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු වන්නේ ය. කොන්ත්‍රාත්තුවට ඇතුලත්වීමේදී එකී ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුවේ කොන්දේසි පිළිපැදීමට බැඳෙමින් ද එකී ඇප තැන්පත් මුදල කොන්ත්‍රාත්තුව පිළිපැදීම වෙනුවෙන් රජයට යටත් කොට බැඳ තබමින් ද බැඳුම්කරයක් අත්සන් කළයුතු වන්නේ ය.

(ආ) පිළිගත් ටෙන්ඩර්කරුගෙන් අවශ්‍යවන ඇපය ශ්‍රී ලංකා ජනරජයේ ඕනෑම පොලී දරණ ණය මුදලක් පිළිබඳ පොරොන්දු නෝට්ටු ආකාරයෙන් ඉදිරිපත් කළ හැකිය. බැංකුවල ස්ථාවර තැන්පත්වලට වඩා මේ ණය මුදල් වලට වැඩි පොලී ප්‍රමාණයක් ලැබෙන අතර ශ්‍රී ලංකා ජනරජය විසින් ඒවා දරන්නාට අර්ධ වාර්ෂිකව පොළිය ගෙවනු ලැබේ. කොන්ත්‍රාත්තුව පිළිබඳ කාලය නිම වී ඇපය නිදහස් කළ හැකි වන විට එම නෝට්ටු ඒවා දරන්නා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුව සමඟ ඉන් අනතුරුව දරණ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ද ඉදිරිපත් කිරීමට පිළිවන. ඉදින් ඒවා දරන්නාට තවදුරටත් ශ්‍රී ලංකා ආණ්ඩුව සමඟ කොන්ත්‍රාත්තු නොමැති නම් විවෘත වෙළඳ පොළෙහි පාඩුවක් නොමැතිව එම නෝට්ටු අලෙවි කරගත හැකිය. බැංකු ද අයිරාවන් සඳහා ඇප වශයෙන් එම නෝට්ටු භාර ගනිති.

**25. ලියාපදිංචි කළ තැපැල් ලිපිනය.**—කොන්ත්‍රාත්තුව අත්සන් කරන විට, පිළිගත් ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුවට සම්බන්ධ කුමන ආකාරයේ හෝ සියලු දැන්වීම් සහ නිවේදනයන් ලියාපදිංචි කළ තැපැලෙන් යැවීමට ලිපිනය ලිවිය යුතු තැපැල් කාර්යලාය හා තැපැල් ලිපිනය ද තෝරාගෙන ස්වකීය අත්සන සහිතව දැන්විය යුතු අතර, එවැනි තැපැල් කාර්යාලයකට යොමුකොට හෝ එවැනි තැපැල් ලිපිනයක් ලියා යථා කාලයේදී තැපැල් කළවිට, එවැනි දැන්වීමක් හෝ නිවේදනයන් තැපැල් කළ දිනයේදීම කොන්ත්‍රාත්කරුට නියමිත පරිදි භාර දුන්නාක් මෙන් ද සෑම කටයුත්තක් සඳහාම කාර්‍ය්‍ය සිද්ධිය වූවාක් මෙන්ද සැලකෙනවා ඇත.

**26. කොන්ත්‍රාත්තුව පැවරීම හෝ අනුපැවරීම.**—ඇටෝර්නි බලය. සුරාබදු කොමසාරිස්ගේ අවසරය නැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් අනෙකකුට පැවරීම හෝ අනුපැවරීම කළ නොහැකිය. කොන්ත්‍රාත්කරු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව කරගෙන යාම සඳහා බලය දෙමින් ඕනෑම පුද්ගලයෙකු වෙත කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කර ඇති ඇටෝර්නි බලයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සුරාබදු කොමසාරිස් වෙත තබා ගනී.

**27. ටෙන්ඩරය අවසන් කිරීමට සිදුවිය හැකි අවස්ථා.**—ඕනෑම අවස්ථාවකදී ටෙන්ඩර්කරු බංකලොත්වී හෝ වස්තු සංගත්වයකට පත්ව ඇතැයි නිශ්චය කරනු ලැබුවහොත් හෝ (ස්වකීය තීරණය අවසාන තීරණය වන්නාවූ) සුරාබදු කොමසාරිස්ගේ විනිශ්චය අනුව මේ කොන්ත්‍රාත්තුවේ කොන්දේසි සාකල්‍යයෙන්ම පිළිපැදීමට නොහැකිවන්නේ නම් වහාම නිශ්චය කොට එය අවසන් කිරීමට සුරාබදු කොමසාරිස්ට බලය ඇත.

**28. වගන්ති සහ කොන්දේසි.**—කොන්ත්‍රාත්තුව පිළිබඳ වගන්ති සහ කොන්දේසි, කොළඹ 1, සුරාබදු කොමසාරිස් කාර්යාලයේදී පරීක්‍ෂා කිරීම සඳහා ලබාගත හැකි කෙටුම්පත් අයුරින් වන්නේ ය. තවදුරටත් කිසියම් තොරතුරක් අවශ්‍ය වෙතොත් කොළඹ, සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලුම් කොට විමසා දත හැකිය.

**29. මෝටර් රථ වාහන සම්බන්ධ ආඥපනත් සහ රෙගුලාසි.**—මෙහි අන්තර්ගතවූ ඕනෑම කරුණක් ඕනෑම අවස්ථාවකදී මෝටර් වාහන සම්බන්ධ ඕනෑම ආඥපනතක්, ව්‍යවස්ථාවක් හෝ නීතියක් හා විරෝධි වන විට මේ කොන්ත්‍රාත්තුව යටතේ තමාගෙ වගකීම ඉටු කිරීම එවැනි නීතියක් නිසා නොහැකි වේ නම් එය මේ ටෙන්ඩර් කොන්දේසි කඩකිරීමක් ලෙස නොසැලකේ.

**30. ටෙන්ඩර් කොන්දේසි පිළිපැදීම.**—ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ සියලුම කොන්දේසි තරයේම සපුරා ඇත්නම් මිස ටෙන්ඩර් පත් සලකා බලනු නොලැබේ.

**31. ටෙන්ඩරවල වලංගු කාලය.**—ටෙන්ඩර් වැසීමේ දිනයේ සිට දින තිහක (30) කාලයකට සියළුම ටෙන්ඩර් වලංගුව පැවතිය යුත්තේ ය.

**32. ටෙන්ඩර පිළිගැනීම් හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය.**—ප්‍රශ්නයක් නොමැතිවම කිසියම් ටෙන්ඩර් පතක් හෝ සියලු ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පතක් පිළිගැනීමේ අයිතිය සුරාබදු දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

**33. පදවල අර්ථ නිරූපනය.**—

(1) සුරාබදු කොමසාරිස්.—යන්නෙන් සුරාබදු කොමසාරිස් පදවිය එවකට දරන්නාවූ නිලධාරියා හෝ ඔහුගේ එම නිලයෙහි අනුප්‍රාප්තිකයා ඇතුලත් වන්නේද, අදහස් වන්නේ ද වෙයි.

(2) සුරාබදු ගුදම් අධිකාරී.—යන්නෙන් සුරාබදු ගුදම් අධිකාරී පදවිය එවකට දරන්නාවූ නිලධාරියා හෝ ඔහු වෙනුවෙන් වැඩබලන ඕනෑම නිලධාරියෙකු ඇතුලත් වන්නේද, අදහස් වන්නේ ද වෙයි.

(3) ගුදම් නිලධාරියා.—යන්නෙන් සුරාබදු ගුදමක් භාරව සිටීමට සුරාබදු කොමසාරිස් විසින් පත් කරන ලද නිලධාරියා හෝ ඔහු වෙනුවෙන් වැඩ බලන ඕනෑම නිලධාරියෙකු ඇතුලත් වන්නේද, අදහස් වන්නේ ද වෙයි.

(4) ස්කාගාර නිලධාරියා.—යන්නේ සුරාබදු කොමසාරිස් විසින් ස්කාගාරයක් භාරවූ සිටීමට පත්කරන ලද නිලධාරියා අදහස් වෙයි.

(5) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්.—ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් යන පදයෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු ඇතුලත් වන්නේද, අදහස් වන්නේ ද වෙයි.

එච්. බී. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් තැනගේ කාර්යාලය,
කොළඹ 1.

දිනය : 1973————.

නිකුත් කරන නිලධාරියාගේ
අත්සන සහ නිලය

මිළ ගණන් සඳහන් කරන තැනැත්තාගේ
අත්සන.

දිනය : 1973————.

10–860—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### සත්ව ගොවිපල්වලට සත්වාහාර ප්‍රවාහනය කිරීම

සීදුවේ පිහිටි තෙල් හා මේධ සංයුක්ත මණ්ඩලයේ සිට පහත සඳහන් ගොවිපල්වලට සත්වාහාර ප්‍රවාහනය කිරීම සඳහා සීල් තබා එවන ටෙන්ඩර් පත්‍ර, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973.02.22 පස්වරු 2 දක්වා භාරගනු ලැබේ.

(1) අඹේවෙල සත්ව ගොවිපල.

(2) බෝපත්තලාව සත්ව ගොවිපල.

(3) අඹේවෙල නවසීලන්ත සත්ව ගොවිපල.

(4) ඩයගම සත්ව ගොවිපල.

2. මෙම සේවාවන් සඳහා යොදවනු ලබන ලොරි ආවරණය කරන ලද ඒවා විය යුතු අතර, බරින් ටොන් 5ට වැඩි විය යුතුය.

3. ප්‍රවාහන සේවාව සෑම දිනකම නොතිබීමට ඉඩ ඇති අතර, අවශ්‍ය වූ ඕනෑම වේලාවක එම ප්‍රවාහන සේවාව ලබාදීමට හැකි අය පමණක් ඉල්ලුම් කළ යුතුය. සාමාන්‍යයෙන් දිනකට ලොරි 15ක් පමණ අවශ්‍ය වන බවද සැලකිය යුතුය.

4. පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් 1973.02.20 දින දහවල් 12 වන තෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ලබා ගෙන නියමිත පරිදි සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලන හා සෞඛ්‍ය අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. එම ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ "ප්‍රවාහන සේවා සඳහා ටෙන්ඩර්" යන්නද ලිවිය යුතුය. ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලබන්නේ කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් රු. 100ක් ඕනෑම කච්චේරියක හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ තැන්පත් කර එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට පමණි.

5. පිළිගනු ලැබුවා වූ ටෙන්ඩරයේ මුළු වටිනාකමින් සියයට 5ක මුදලක් හෝ නියම කරනු ලබන මුදලක් හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට ටෙන්ඩර්කරුට සිදුවන අතර, ගිවිසුම් පත්‍රයකට හෝ පොරොන්දු පත්‍රයකට ඔහුට බැඳීමට සිදුවනු ඇත. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ කොන්ත්‍රාත්තුව අවලංගු කර නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

6. යම් කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමටත්, කිසියම් ටෙන්ඩර් පත්‍රයකින් කොටසක් පිළිගැනීමටත් කෘෂිකර්ම අධ්‍යක්ෂකට බලය ඇත.

7. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතේ (107 වන පරිච්ඡේදය) යටතේ තමාගේ කිසියම් සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුය.

8. මේ සඳහා වැඩි විස්තර අවශ්‍ය නම් එක් එක් ස්ථාන භාර නිලධාරි තැනගෙන් විමසිය යුතුය.

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
සත්ව පාලන හා සෞඛ්‍ය.

1973 ජනවාරි මස 15 වැනි දින,
පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සත්ව පාලන සෞඛ්‍ය කාර්යාලයේ දී ය.

1–954—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### 1973 මාර්තු 1 වැනි දින සිට 1973 නොවැම්බර් 30 වැනි දින දක්වා වූ කාලය සඳහා සීදුවේ බණ්ඩාරවත්තේ, රජයේ අරක්කු ස්කාගාරයට රා සැපයීම පිළිබඳ ටෙන්ඩර් කොන්දේසි

සීදුවේ, බණ්ඩාරවත්තේ පිහිටි රජයේ අරක්කු ස්කාගාරයට අලුත්, අමිශ්‍ර, බාල නොකළ පැසවූ පොල් රා සැපයීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, තැ. පෙ. අංක 500, කොළඹ 1 විසින් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

පහත සඳහන් කිසිම තැනැත්තෙකුගේ ටෙන්ඩර් පත් සලකා බැලීම හෝ ඔවුන් සමග කොන්ත්‍රාත්තුවලට ඇතුළත් වීම හෝ කරනු නොලැබේ.

(ඒ) ශ්‍රී ලංකා පුරවැසියකු නොවන්නකු, හෝ

(බී) සුරාබදු බලපත්‍ර දැරීම තහනම් කරනු ලැබූවන්ගේ නාමාවලියෙහි නම සඳහන් වන්නාවූ හෝ තනි වශයෙන් හෝ අන් කිසි පුද්ගලයකු සමග හෝ එක්ව රජයේ හෝ සුරාබදු දෙපාර්තමේන්තුවේ හෝ කොන්ත්‍රාත්තු කඩකළවුන්ගේ නාමාවලියෙහි නම සඳහන් වන්නාවූ හෝ තැනැත්තකු, හෝ,

(සී) (i) ස්කාගාරය සඳහා රා මදින ප්‍රදේශය තුළ පිහිටි රා තැබෑරුම්ක රේන්දකරුවකු හෝ,

(ii) රා තැබෑරුම්වලට රා සපයන කොන්ත්‍රාත්කරුවකු හෝ,

(iii) ස්කාගාරය සඳහා රා මදින ප්‍රදේශය තුළ සිටින තමාගේ බලපත්‍රය ආපසු භාර නොදෙන මීරා බලපත්‍රධාරියකු හෝ,

(iv) ස්කාගාරය සඳහා රා මදින ප්‍රදේශය තුළ බෝතල්ගත කළ රා නිපදවන්නකු හෝ යන වර්ගවලට අයත් පුද්ගලයක්.

2. මේ රා සැපයීම 1936 ජූලි මස 3 වැනි දින අංක 8232 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ අංක 288, 289, 290, 291 යන සුරාබදු නිවේදනයන්ට ද, 1939 අගෝස්තු මස 18 වැනි දින අංක 8474 දරණ ගැසට් පත්‍රයේ පළවූ අංක 347 සහ 348 දරණ නිවේදනයන්ට ද, 1943 පෙබරවාරි මස 26 වැනි දින අංක 9090 දරණ ගැසට් පත්‍රයේ පළවූ අංක 375 දරණ නිවේදනයන්ට ද රා මැදීම සහ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් කලින් කලට ක්‍රියාත්මකව පවත්නා අනෙක් නීතිවලට ද යටත් වන්නේ ය.

3. ගැලුමක් යන්නෙන් අළුත්වූද, අමිශ්‍රවූද පරිමාවෙන් සියයට 7.5ක මද්‍යසාර ප්‍රමාණයක් ඇත්තාවූද පැසවූ රා අදහස් කෙරේ.

4. සෑම ටෙන්ඩර්කරුවෙකුම තම කොන්ත්‍රාත්තුවට ඇතුළත් වන ගස් ගණන පැහැදිලි ලෙස වචනයෙන් සහ ඉලක්කමින් සඳහන් කොට එක් එක් රා ගැලුම වෙනුවෙන් වූ මිළ ගණන රුපියල් ශත වලින් ද දක්විය යුතුය. එම මිළ ගණනට දනට පවත්නා අනුමත කළ රා එකතු කිරීමේ මධ්‍යස්ථානයකට හෝ රා සැපයීමේ ඉහත කී කාලපරිච්ඡේදය තුළ කලින් කලට සුරාබදු කොමසාරිස් විසින් අනුමත කළහැකි වන්නාවූ, අනෙක් රා එකතු කිරීමේ මධ්‍යස්ථානවලට හෝ රා ප්‍රවාහනය කිරීමේ වියදම් ද ඇතුළත් විය යුතුය.

5. (ඒ) කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ පිහිටි, ප්‍රධාන සුරාබදු කාර්යාලයේදී හෝ කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත පිහිටි කච්චේරිය කදී හෝ රු. 100ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පිළිගත් ටෙන්ඩර්කරු සමග කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසුව භාර නොගත් ටෙන්ඩර් පත් හිමියන්ගේ තැන්පත් ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර්කරු තම ටෙන්ඩර් පතෙහි දක්වා ඇති ලිපිනයට පිළිගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය පිළිගැනීමේ නිවේදනය යවනු ලැබේ.

(බී) කෙසේ වුවද, එබඳු තැන්පත් මුදලක් බැඳීමෙන් පහත සඳහන් අය නිදහස් කරනු ලබති:—

(i) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති;

(ii) සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

6. සුරාබදු කොමසාරිස් විසින් සපයනු ලබන ආකෘති පත්‍රයන්හි ටෙන්ඩර් ඉදිරිපත් කළයුතු අතර, අනෙක් කිසිම ආකෘති පත්‍රයක ලියා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත් සලකා බලනු නොලැබේ. 1973 පෙබරවාරි මස 14 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත් සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.

7. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන්නකු විසින් ඒවා නිකුත් කරන නිලධාරියා වෙත—

(ඒ) 5 (බී) වගන්තිය යටතේ නිදහස් කොට ඇති අය හැර අනෙක් අය රු. 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ද;

(ඕ) තමාගේ සම්පූර්ණ නම සහ ලිපිනයත්, තමාගේ නිශ්චල දේපල හෝ අනෙක් වත්කම් හෝ පිහිටි දිස්ත්‍රික්ක, ඒවා පිළිබඳ සම්පූර්ණ විස්තරත්, ඇතුළත් ලිඛිත ප්‍රකාශනයන්ද ;

(ඖ) රජය සමග මින් පෙර දැරූ කොන්ත්‍රාත්තුවක් ඇත්නම් ඒ වගද, ඊට අදාල වූ දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්ක ද දෙපාර්තමේන්තුව හෝ දෙපාර්තමේන්තු ද පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

8. සියලුම ටෙන්ඩර් පත් පිටපත් 2 කින් යුක්ත වියයුතු අතර, තමාගේ අත්සන යොදන ලද මේ කොන්දේසි පිටපතක් සමග එක් කවරයක බහා මුද්‍රා තබා, කොළඹ 1, තැ. පෙ. අංක 500, මහලේකම් කාර්යාලයේ පිහිටි මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය. සියලු වෙනස් කිරීම් සහ මකා හැරීම් ටෙන්ඩර්කරුවන්ගේ කෙටි අත්සන යොදා වලංගු කොට තිබිය යුතුය.

9. ටෙන්ඩර් පත් බහාලු කවරයේ වම උඩ කෙළවරේ "සිදුවේ රජයේ ස්කාගාරයට රා සැපයීම සඳහා ටෙන්ඩර් පත" යනුවෙන් ලකුණුකොට 1973 පෙබරවාරි 15 වැනි දින පෙ. ව. 10 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ එවිය යුතුය.

ටෙන්ඩර් පත් එක්කෝ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නැත්නම් ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් කොළඹ 1, මහලේකම් කාර්යාලයේ 2 වැනි මහලේ 263 වැනි කාමරයේ සිටින මහා භාණ්ඩාගාරයේ මධ්‍යම ටෙන්ඩර් ශාඛාවේ නියෝජ්‍ය මුදල් අධ්‍යක්ෂක වෙත පෞද්ගලිකව භාරදී කුවිතාන්සියක් ලබාගත යුතුය.

ටෙන්ඩර් පත් 1973 පෙබරවාරි 15 දින පෙ. ව. 10 ට කොළඹ 1, තැ. පෙ. අංක 500, මහලේකම් කාර්යාලයේ පිහිටි මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයේදී විවෘත කර ටෙන්ඩර්කරුවන්ගේ නම් ද සඳහන් කොට ඇති මිල ගණන් ද කියවනවා ඇත. ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට ඉඩ දෙනු ලැබේ.

යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් මිල ගණන සඳහා පමණක් නැවත පරීක්ෂා කරවීමට අදහස් කරන ටෙන්ඩර්කරුවෙකු වේ නම් මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලය විසින් ටෙන්ඩර් පිළිබඳව අවසාන තීරණයක් ගැනීමට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සමග පිළිවෙලක් යොදාගෙන එසේ කිරීමට ඉඩදෙනු ලැබේ.

10. මෙහි සඳහන් කොට ඇති සියලුම කොන්දේසි සරයේ සපුරා ලනු ලැබෙතොත් මිස කිසිම ටෙන්ඩර් පතක් ගැන සලකා බලනු නොලැබේ.

11. සියලු ටෙන්ඩර් පත් භාරගෙන අවසන්වූ දින සිට දින 30 ක කාල පරිච්ඡේදයක් තුළදී පිළිගැනීම සඳහා වලංගුව තිබිය යුතුය. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය තබා ගනී.

12. තමාගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැනුම් දෙනු ලැබ දින 14 ක් ඇතුළතදී තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු—

(ඒ) පහත දක්වෙන ඇප තැන්පත් පරිමාන අනුව ගෙවිය යුතු මුදල් ප්‍රමාණයක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් වන ගස් ගණන වෙනුවෙන් ඇප තැන්පත් වශයෙන් සුරාබදු කොමසාරිස් වෙත බැඳිය යුතුය :—

| කොන්ත්‍රාත්තුවට ඇතුළත් වන ගස් ගණන | ගෙවිය යුතු ඇප තැන්පත් මුදල |
|---|---|
| 1 සිට 5,000 දක්වා | ... රු. 1,000 (අවම) |
| 5,001 සිට 10,000 දක්වා | ... රු. 2,000 |
| 10,001 සිට 15,000 දක්වා | ... රු. 3,000 |
| 15,001 සිට 20,000 දක්වා | ... රු. 4,000 |
| 20,001 සිට 25,000 දක්වා | ... රු. 5,000 (උපරිම) |

(බී) මේවා සහ අනෙක් සාමාන්‍ය කොන්දේසි අන්තර්ගත වන කොන්ත්‍රාත්තුවකට ඇතුළත් විය යුතුය.

තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු එකී මුදල ඇප වශයෙන් තැබීමට හෝ විධිමත් කොන්ත්‍රාත්තුවට ඇතුළත්වීමට හෝ අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ ඔහු තැබූ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට රජයේ කොන්ත්‍රාත්තුවලට ඇතුළත්වීම වළක්වාළමින් ඔහුගේ නම කොන්ත්‍රාත්තු කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඇතුළත් කරනු ඇත.

13. කොන්ත්‍රාත්තුවට ඇතුළත් වීමෙන් පසුව ප්‍රථමයෙන් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ කැමැත්ත ලියවිල්ලකින් ලබා නොගෙන එය අන් අයට පැවරීමට හෝ අතුරු බදු දීම නොකළ යුතු අතර මොනම කරුණක් නිසා හෝ එම කොන්ත්‍රාත්තුව රජයේ කොන්ත්‍රාත්තු කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි නම ඇතුළත් වන්නාවූ පුද්ගලයකුට පැවරීම හෝ බෙදාදීම ද එවැනි පුද්ගලයකු වෙත ඇටෝර්නි බලය පැවරෙන ලියවිල්ලක් නිකුත් කිරීම ද නොකළ යුතුය.

14 ටෙන්ඩර්කරුවන් විසින් පැසවූ රා මැදීම සඳහා තිබෙන ගස් ගණන ඔවුන්ගේ ටෙන්ඩර් පත්වල සඳහන් කළ යුතුය.

15. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ පිහිටි ප්‍රධාන සුරාබදු කාර්යාලයෙන් ලබාගත හැක.

ජේ. බී. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

ප්‍රධාන සුරාබදු කාර්යාලය,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973.01.13.

1–871—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

රාජ්‍ය දැව සංස්ථාව

ක්‍රියෝසෝට් (දැව ආරක්ෂිතය) තෙල් ගැලුම් 2,00,000ක් සැපයීම සඳහා ටෙන්ඩරය

ක්‍රියෝසෝට් (දැව ආරක්ෂිතය) තෙල් ගැලුන් 2,00,000 ක් සැපයීම සඳහා ප්‍රධාන ගණකාධිකාරී තැන විසින් 1973.03.28 දින පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. රු 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා ආපසු නොගෙවන රු. 10 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් ගෙවීමෙන් සැපයීම් නිලධාරිගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පත්වල ටෙන්ඩර ඉදිරිපත් කළ යුතු වේ. 1973. 03. 27 දින දහවල් 12න් පසු ටෙන්ඩර්පත් නිකුත් කරනු නොලැබේ. වැඩි විස්තර බලාගැනීම සඳහා ටෙන්ඩර්පත් මෙම කාර්යාලයෙහි තබා ඇත.

සැපයීම් නිලධාරී,
රාජ්‍ය දැව සංස්ථාව.

7, වජිර පටුමග,
කොළඹ 5.

1–991/1—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

රාජ්‍ය දැව සංස්ථාව

බෝර්මන් ඩීසල් යන්ත්‍ර දෙකක් මිලටගෙන ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩරය

බෝර්මන් ඩීසල් යන්ත්‍ර දෙකක් මිලටගෙන ඉවත්කර ගැනීම සඳහා, ප්‍රධාන ගණකාධිකාරී තැන විසින් 1973.02.21 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර්පත් බාරගනු ලැබේ. රු. 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් හා ආපසු නොගෙවන රු. 10 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් ගෙවීමෙන් සැපයීම් නිලධාරිගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුවේ. 1973.02.20 දින දහවල් 12න් පසු ටෙන්ඩර්පත් නිකුත් කරනු නොලැබේ. වැඩි විස්තර බලාගැනීම සඳහා ටෙන්ඩර්පත් මෙම කාර්යාලයෙහි තබා ඇත.

සැපයීම් නිලධාරී.

7, වජිර පටුමග,
කොළඹ 5.

1–991/2—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## සුරාබදු දෙපාර්තමේන්තුව

### මහනුවර සුරාබදු ගුදම් ක්‍රියාකරවීම හා සම්බන්ධ මත්පැන් සහ අනෙක් බඩු ප්‍රවාහනය කිරීම සඳහා වූ ටෙන්ඩර් පත

(අ) මහනුවර ගුදම සහ දුම්රිය බඩු ගබඩාව අතර දී,

(ආ) සීදූව, මීගමුව, මහනුවර, බදුල්ල, හිඟුරන, මඩකලපුව, ත්‍රිකුණාමලය, කන්තලේ, වවුනියාව සහ යාපනයේ පිහිටි ස්කාගාර/ගුදම් අතර 1973 මාර්තු 1 දා එම ආරම්භ කොට 1973 දෙසැම්බර් 31 ට අවසන් වන වර්ෂය සඳහා

මත්පැන්, පීප්ප, බෝතල, ලී පෙට්ටි සහ අනෙක් බඩු මෝටර් ලොරිවලින් ප්‍රවාහනය කිරීමට සමූපකාර සමිති වලින්, ප්‍රවාහන පුද්ගලයන්ගෙන් හෝ සමාගම්වලින් හා සමූපකාර සමිතිවලින් ද කොළඹ 1, සුරාබදු දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

1. ටෙන්ඩර් ආකෘති පත්‍ර :

(අ) ටෙන්ඩර් කොළඹ 1, සුරාබදු කොමසාරිස්ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු වේ. සුරාබදු කොමසාරිස් විසින් නිකුත් කරන ලද පිළිගත් ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කරනු නොලැබේනම් ටෙන්ඩරය ගැන සලකා බලනු නොලැබේ.

(ආ) ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිකුත් කිරීමට පෙර කොළඹ සුරාබදු කොමසාරිස් කාර්යාලයේ හෝ කච්චේරියක රු. 100 ක් තැන්පත් කොට ඒ පිළිබඳ කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. තමාගේ ටෙන්ඩරය පිළිගත් බව දන්වා සුරාබදු කොමසාරිස්ගෙන් ලියවිල්ලක් ලැබී දින 10ක් ඇතුළත ටෙන්ඩරය පිළිගනු ලැබූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුවට හෝ බැඳුම්කරයට ඇතුළත්වීම ප්‍රතික්ෂේප කළහොත් හෝ අපොහොසත් වුවහොත් ද අනුමත කළ ඇපය තැබීමට අපොහොසත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආණ්ඩුව සන්තකකොට ආණ්ඩුවේ කිසිදු කොන්ත්‍රාත්තුවකට ඔහු සම්බන්ධවීම වලක්වාලමින් ඔහුගේ නම කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබීමට ඉඩ ඇත. ටෙන්ඩරය පිළිගත් බවට කෙරෙන දැන්වීම ටෙන්ඩර්කරු විසින් දී ඇති ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් යවන ලද නම් හෝ එම ලිපිනය ඇති ස්ථානයෙහි තබා එන ලද නම් හෝ එය ටෙන්ඩර්කරුට ලැබුණක් සේ සලකනු ලැබේ. කොන්ත්‍රාත්තුව අත්සන් කළ පසු ටෙන්ඩර් ඉදිරිපත් කළ සියළුම පුද්ගලයන්ගේ තැන්පත් මුදල් ආපසු දෙනවා ඇත. ටෙන්ඩර්කරුවන් 73. 02. 08 දින මධ්‍යාහ්න 10 පෙර ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා වූ ඇප තැන්පත් කොට, අවශ්‍ය ආකෘති පත්‍ර ලබාගත යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර 73. 02. 08 න් පසු නිකුත් කරනු නොලැබේ.

(ඇ) ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමෙන් පසුව, ටෙන්ඩර් ඉදිරිපත් නොකොට සිටින පුද්ගලයින්ගේ ටෙන්ඩර් තැන්පතු, ටෙන්ඩර් ආකෘති පත්‍රය සහ ටෙන්ඩර් ආකෘති පත්‍රය සමග ඔවුන් වෙත නිකුත් කරන ලද අන් සියළුම ලියවිලි ටෙන්ඩරය වැසීමට නියමිත දින සහ වේලාවට පෙර, නිසි ලෙස ආපසු එවන්නේ නම් පමණක් ආපසු ගෙවනු ලැබේ.

(ඈ) කෙසේ වෙතත්, පහත නම් සඳහන් අය මේ තැන්පත් මුදල් ගෙවීමෙන් නිදහස් වෙති :—

(i) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ii) අනෙක් ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන,

(iii) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති,

(iv) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කළ සමූපකාර සමිති.

2. සේවාව සඳහා මිල ගණන් දක්වන ක්‍රමය සහ ටෙන්ඩර් ආකෘතියෙහි ඉදිරිපත් කළයුතු විස්තර :

(අ) පහත සඳහන් අයුරින් කොටස් දෙකකින් ටෙන්ඩර්කරුවන් සේවාව සඳහා මිල ගණන් දැක්විය යුතුය :—

(1) මහනුවර සුරාබදු ගුදම් සහ දුම්රිය බඩු ගබඩාව අතර මෝටර් ලොරියක් ක්‍රියාකරවීම සඳහා මාසික කැපසුම්කට ගාස්තු ප්‍රමාණය.

(2) සීදූව, මීගමුව, මහනුවර, බදුල්ල, හිඟුරන, මඩකලපුව, ත්‍රිකුණාමලය, කන්තලේ, වවුනියාව සහ යාපනයේ සුරාබදු ස්කාගාර/ගුදම් අතර ... ස්කාගාර/ගුදම් ...

(ආ) සෑම ටෙන්ඩර් කරුවකුම ස්වකීය ටෙන්ඩරයෙහි ටෙන්ඩර් කරන ලද සේවාව සඳහා පාවිච්චි කිරීමට ඔහු යෝජනා කරන, සවකීය නමට ලියාපදිංචිකර තිබෙන මෝටර් ලොරි වල ලියාපදිංචි කළ අංක සඳහන් කළ යුතුය.

(ඇ) මෙම ටෙන්ඩරය යටතේ පාවිච්චි කිරීමට බලාපොරොත්තු වන එක් එක් මෝටර් ලොරිය—

(1) අවම වශයෙන් ටොන් 5 ක ප්‍රවාහන බර ප්‍රමාණයක් නියමිතව තිබිය යුතුය.

(2) ගාස්තුවක් හෝ පාරිතෝෂිකයක් ලබමින් ප්‍රවාහනයෙහි යෙදවීමට බලය ලබා තිබිය යුතුය.

(3) වාහන පාවිච්චි කළයුතු වන්නාවූ ධාවන මාර්ගයන් සඳහා බඩු ගෙනයාමේ අවසර පත්‍රයක් තිබිය යුතුය.

(4) නිසි ලෙස බලපත්‍ර ලබා, රක්ෂණය කොට තිබිය යුතුය.

3. ටෙන්ඩර් පිළිගැනීමේ බාධක, නුසුදුසුකම් :

ටෙන්ඩර් පත් :

1. ශ්‍රී ලංකා පුරවසියෙකු නොවන කිසිම තැනැත්තකුගෙන් හෝ සියලුම කොටස්කරුවන්/සාමාජිකයන් ශ්‍රී ලංකා පුරවැසියන් නොවන කිසිම සමාගමකින් හෝ සමූපකාර සමිතියකින්, හෝ

2. යටත් පිරිසෙයින් මෝටර් ලොරි හයකවත් ලියාපදිංචි කළ හිමිකරු නොවන පුද්ගලයෙකුගෙන් හෝ සමාගමකින් හෝ සමූපකාර සමිතියකින්, හෝ

3. රාජ්‍ය/සුරාබදු කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයෙහි නම සඳහන් වන්නාවූ කෙනෙකුගෙන්, හෝ

4. අපරාධ නිවාරණ ආඥාපනතින් අදහස් කරන අයුරු, අපරාධ කාරයෙකු වන්නා කෙනෙකුගෙන්, හෝ

5. අරක්කු නිෂ්පාදනය කිරීමට හෝ පදම් කිරීමට හෝ විකිණීමට බලපත්‍රයක් දරන්නකුගෙන් භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය :

ටෙන්ඩර්පත් 1973 පෙබරවාරි 9 දින පෙ. ව. 11ට කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, 1 වෙනි මහලේ සුරාබදු කොමසාරිස් කාර්යාලයේදී, සුරාබදු කොමසාරිස් විසින් වසනු ලැබේ.

5. ටෙන්ඩර් පත් එවිය යුත්තේ කෙසේද යන වග :

(අ) සියලු ටෙන්ඩර් පත් අනුපිටපතකින් යුක්තවිය යුතු අතර එක් එක් පිටපත ටෙන්ඩර්කරු විසින් අත්සන් කොට, ටෙන්ඩරයේ කොන්දේසිවලට ඔහු එකඟ වන බවට ලියවිල්ලක් වශයෙන් ටෙන්ඩර්කරු විසින් අත්සන් තැබූ, මෙම කොන්දේසිවල පිටපතක් සමඟ, මුද්‍රා තැබූ එක් කවරයක බහා එවිය යුතුය. මුද්‍රා තබන ලද කවරයේ උඩ මිම් කෙළවරේ, "ප්‍රවාහණ ටෙන්ඩරය—මහනුවර ගුදම" සයි ලකුණු කරන ලදුව, කොළඹ 1, සුරාබදු දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යන ලිපිනයට ලිවිය යුතුය. ටෙන්ඩර් කරනු ලබන මිල ප්‍රමාණය ඉලක්කම් වලින් මෙන්ම වචනයෙන්ද දක්වන ලදුව ටෙන්ඩර් කරනු ලබන මිල ප්‍රමාණයන් සහ වෙනත් තොරතුරු පැහැදිලිව සටහන් කළ යුතුය. සියලුම වෙනස් කිරීම් සහ මැකීම් ටෙන්ඩර්කරු විසින් සහතික කළ යුතුය. එසේ නොවුවහොත් ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරනු ලැබිය හැකිය.

(ආ) ටෙන්ඩර්කරුවන් විසින් ලියාපදිංචි කළ තැපැලෙන් ටෙන්ඩර් එවිය යුතුය. නැතහොත් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්, ටෙන්ඩර් වැසීමට නියම කොට තිබෙන දිනය සහ වේලාවට කලින් ටෙන්ඩර් පත් ගෙනැවිත්, කොළඹ 1, සුරාබදු දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන ලිපිකරුට පෞද්ගලිකව භාර දිය යුතුය. ප්‍රධාන ලිපිකරු එවැනි ටෙන්ඩර් පතක් ලැබුණ විට මුද්‍රා තැබූ ටෙන්ඩරය භාරදුන් තැනැත්තාට එය භාරගත් බවට වහාම ලියවිල්ලක් දී මුද්‍රා තැබූ ටෙන්ඩරය එවේලේම ඒ නිලධාරියා විසින් ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය.

6. ටෙන්ඩර් විවෘත කිරීම :

ටෙන්ඩර් 73. 02. 09 දින පෙරවරු 11 කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, සුරාබදු කොමසාරිස් කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටීමට ඉඩ දෙනු ඇත. ටෙන්ඩර් පත් විවෘත කරන නිලධාරියා විසින් එහි පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ට ඇසෙන සේ ටෙන්ඩර්කරුවන්ගේ නම් ද එමෙන්ම මිල ගණන් ද කියවනවා ඇත.

කිසියම් ටෙන්ඩර්කරුවෙකු කැමති නම්, ටෙන්ඩර් විවෘත කරන නිලධාරියට ඉල්ලීමක් කර, ඉදිරිපත් කර ඇති මිනෑම ටෙන්ඩරයක අනුපිටපත පරීක්ෂා කළ හැකිය

**27. ඇප තැන්පත් මුදල :**

(අ) 27 වැනි කොන්දේසිය ප්‍රකාර කොන්ත්‍රාත්තුවකට ඇතුළත් වීමට පෙර පිළිගත් ටෙන්ඩර්කරු සුරාබදු කොමසාරිස් වෙත රුපියල් පන් දහසක් (රු. 5,000) මුදලින් තැන්පත් කොට ඒ පිළිබඳ කුවිතාන්සිය ඉදිරිපත් කළයුතු වන්නේය. කොන්ත්‍රාත්තුවට ඇතුළත්වීමේදී එකී ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුවේ කොන්දේසි පිළිපැදීමට බැඳෙමින් ද එකී ඇප තැන්පත් මුදල කොන්ත්‍රාත්තුව පිළිපැදීම වෙනුවෙන් රජයට යටත්කොට බැඳ තබමින් ද බැඳුම්කරයක් අත්සන් කළයුතු වන්නේ ය.

(ආ) පිළිගත් ටෙන්ඩර්කරුගෙන් අවශ්‍යවන ඇපය ශ්‍රී ලංකා ජනරජයේ ඕනෑම පොලී දරණ ණය මුදලක් පිළිබඳ පොරොන්දු නෝට්ටු ආකාරයෙන් ඉදිරිපත් කළ හැකිය. බැංකුවල ස්ථාවර තැන්පතුවලට වඩා මේ ණය මුදල් වලට වැඩි පොලී ප්‍රමාණයක් ලැබෙන අතර ශ්‍රී ලංකා ජනරජය විසින් ඒවා දරන්නාට අර්ධ වාර්ෂිකව පොලිය ගෙවනු ලැබේ. කොන්ත්‍රාත්තුව පිළිබඳ කාලය නිමවී ඇපය නිදහස් කළ හැකි වන විට එම නෝට්ටු ඒවා දරන්නා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුව සමග ඉන් අනතුරුව දරණ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ද ඉදිරිපත් කිරීමට පිළිවන. ඉදින් ඒවා දරන්නාට තවදුරටත් ශ්‍රී ලංකා ආණ්ඩුව සමග කොන්ත්‍රාත්තු නොමැති නම් විවෘත වෙළඳ පොළෙහි පාඩුවක් නොමැතිව එම නෝට්ටු අලෙවි කරගත හැකිය. බැංකු ද අයිරාවන් සඳහා වශයෙන් මේ නෝට්ටු භාර ගනිති.

**28. ලියාපදිංචි කළ තැපැල් ලිපිනය :**

කොන්ත්‍රාත්තුව අත්සන් කරන විට, පිළිගත් ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුවට සම්බන්ධ කුමන ආකාරයේ හෝ සියලු දැන්වීම් සහ නිවේදනයන් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවීමට ලිපිනය ලිවිය යුතු තැපැල් කාර්යාලය හා තැපැල් ලිපිනය ද තෝරාගෙන ස්වකීය අත්සන සහිතව දැන්විය යුතු අතර, එවැනි තැපැල් කාර්යාලයකට යොමුකොට හෝ එවැනි තැපැල් ලිපිනයක් ලියා යවා කාලයේදී තැපැල් කළ විට, එවැනි දැන්වීමක් හෝ නිවේදනයන් තැපැල් කළ දිනයේදීම කොන්ත්‍රාත්කරුට නියමිත පරිදි භාර දුන්නාක් මෙන් ද සැම කටයුත්තක් සඳහාම කාර්ය සිද්ධිය වූවාක් මෙන් ද සැලකෙනවා ඇත.

**29. කොන්ත්‍රාත්තුව පැවරීම හෝ අනුපැවරීම :**

ඇටෝර්නි බලය.—සුරාබදු කොමසාරිස්ගේ අවසරය නැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් අනෙකකුට පැවරීම හෝ අනුපැවරීම කළ නොහැකිය. කොන්ත්‍රාත්කරු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව කරගෙන යාම සඳහා බලය දෙමින් ඕනෑම පුද්ගලයෙකු වෙත කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කර ඇති ඇටෝර්නි බලයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සුරාබදු කොමසාරිස් වෙත තබා ගනී.

**30. ටෙන්ඩරය අවසන් කිරීමට සිදුවිය හැකි අවස්ථා :**

ඕනෑම අවස්ථාවකදී ටෙන්ඩර්කරු බංකොලොත් වී හෝ වස්තු භංගත්වයකට පත්ව ඇතැයි නිශ්චය කරනු ලැබුවහොත් හෝ (ස්වකීය තීරණය අවසාන තීරණය වන්නාවූ) සුරාබදු කොමසාරිස්ගේ විනිශ්චය අනුව මේ කොන්ත්‍රාත්තුවේ කොන්දේසි සාකල්‍යයෙන්ම පිළිපැදීමට නොහැකි වන්නේ නම් වහාම නිශ්චය කොට එය අවසන් කිරීමට සුරාබදු කොමසාරිස්ට බලය ඇත.

**31. වගන්ති සහ කොන්දේසි :**

කොන්ත්‍රාත්තුව පිළිබඳ වගන්ති සහ කොන්දේසි, කොළඹ 1, සුරාබදු කොමසාරිස් කාර්යාලයේදී පරීක්ෂා කිරීම සඳහා ලබාගත හැකි කෙටුම්පත් අනුසාරින් වන්නේ ය. තවදුරටත් කිසියම් තොරතුරක් අවශ්‍ය වෙතොත් කොළඹ, සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලුම් කොට විමසා දත හැකිය.

**32. මෝටර් රථ වාහන සම්බන්ධ ආඥාපනත් සහ රෙගුලාසි :**

මෙහි අන්තර්ගත වූ ඕනෑම කරුණක් ඕනෑම අවස්ථාවකදී මෝටර් වාහන සම්බන්ධ ඕනෑම ආඥාපනතක්, ව්‍යවස්ථාවක් හෝ නීතියක් හා විරෝධී වන විට මේ කොන්ත්‍රාත්තුව යටතේ තමාගේ වගකීම ඉටුකිරීම එවැනි නීතියක් නිසා නොහැකිවේ නම් එය මේ ටෙන්ඩර් කොන්දේසි කඩකිරීමක් ලෙස නොසැලකේ.

**33. ටෙන්ඩර් කොන්දේසි පිළිපැදීම :**

**34. ටෙන්ඩර්වල වලංගු කාලය :**

සියලු ටෙන්ඩර් ස්ථිර විය යුතු අතර ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් දින සිට දින 30 කට වලංගු විය යුතුය.

ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ සියලුම කොන්දේසි තරයේම සපුරා ඇත්නම් මිස ටෙන්ඩර්පත් සලකා බලනු නොලැබේ.

**35. ටෙන්ඩර් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය :**

ප්‍රශ්නයක් නොමැතිවම කිසියම් ටෙන්ඩර්පතක් හෝ සියලු ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පතක් පිළිගැනීමේ අයිතිය සුරාබදු දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

**36. පදවල අර්ථ නිරූපනය :**

(1) සුරාබදු කොමසාරිස් යන්නෙන් සුරාබදු කොමසාරිස් පදවිය එවකට දරන්නාවූ නිලධාරියා හෝ ඔහුගේ එම නිලයෙහි අනුප්‍රාප්තිකයා ඇතුළත්වන්නේ ද, අදහස් වන්නේ ද වෙයි.

(2) සුරාබදු ගුදම් අධිකාරී යන්නේ සුරාබදු ගුදම් අධිකාරි පදවිය එවකට දරන්නාවූ නිලධාරියා හෝ ඔහු වෙනුවෙන් වැඩබලන ඕනෑම නිලධාරියෙකු ඇතුළත් වන්නේ ද, අදහස් වන්නේ ද වෙයි.

(3) ගුදම් නිලධාරියා යන්නෙන් සුරාබදු ගුදමක් භාරව සිටීමට සුරාබදු කොමසාරිස් විසින් පත්කරන ලද නිලධාරියා හෝ ඔහු වෙනුවෙන් වැඩබලන ඕනෑම නිලධාරියෙකු ඇතුළත් වන්නේ ද, අදහස් වන්නේ ද වෙයි.

(4) ස්කාගාර නිලධාරියා යන්නෙන් සුරාබදු කොමසාරිස් විසින් ස්කාගාරයක් භාරව සිටීමට පත්කරන ලද නිලධාරියා අදහස් වෙයි.

(5) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් යන පදයෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු ඇතුළත්වන්නේ ද, අදහස් වන්නේද වෙයි.

ජේ. ඩ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කායඨාලය,
කොළඹ 1.

1–859—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

**ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව**

**එනමල් තීන්ත සැපයීම**

ලී වලින් සාදන ලද ජනෙල්, දොරවල් යනාදියෙහි පිටතට සහ ඇතුලතට ගෑමට සුදුසු ඉක්මනින් වේලෙන තද ඔපය සහිත එනමල් තීන්ත සැපයීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1973. 02. 15 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**ප්‍රමාණය :**

| | | |
|---|---|---|
| කුනී අලුපාට (FLAKE GRAY) ගැලුම් බ්‍රිතාන්‍ය සම්මත වර්ණෝරුව 9-094 | — | 125 |
| තද අලුපාට (ASH GRAY) ගැලුම් බ්‍රිතාන්‍ය සම්මත වර්ණෝරුව 9-096 | — | 100 |
| සුදු පාට (WHITE) — ... | — | 40 |

2. ටෙන්ඩර් කරුවන් විසින් සැපයීම කළයුත්තේ (ඒ) තිබෙන තොගයෙන් කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාරදීමටත් ය. ටෙන්ඩර් කරුවන් විසින් භාරදිය හැකි ඉතාම නුදුරු කාල සීමාව සඳහන් කළ යුතුය.

3. 1973. 02. 14 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝරමයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ, යෝර්ක් වීදියේ, ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරන ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 50.00 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝරම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි

4. ටෙන්ඩර් පෝරම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ "එනමල් තීන්ත සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ආපසු ගෙන්වා ගත නොහැකිය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වේනොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1973. 2. 15 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරුතැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1973 ජනවාරි 13.
සිවී/2/449.

1-925—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, ගාල්ල

1973 මුදල් වර්ෂයේ පළමු භාගය සඳහා ප්‍රාදේශීය ද්‍රව්‍ය මිලදී ගැනීම

1973 මුදල් වර්ෂයේ පළමු භාගය සඳහා ගොඩනැගිලි තැනීමේ ප්‍රාදේශීය ද්‍රව්‍ය සැපයීම් පිණිස පහත සඳහන් කොට්ඨාශයන් වෙනුවෙන් ටෙන්ඩර් පත් මවිසින් කැඳවනු ලැබේ:—

මාතර දිස්ත්‍රික්කය : රොටුඹ.

රත්නපුර දිස්ත්‍රික්කය : අයගම, ඉඹුල්පෙ.

මොණරාගල දිස්ත්‍රික්කය : හඳපාන්ගල.

හම්බන්තොට දිස්ත්‍රික්කය : මුරුතවෙල, අංශ 2, මුරුතවෙල අංශ 3, වීරකැටිය.

2. ගාල්ල, ඉඩම් සංවර්ධන කාර්යාලයේදී ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1973 පෙබරවාරි 20 දින ප. ව. 2 දක්වා 1973 මුදල් වර්ෂයේ පළමු භාගය සඳහා (1973.01.01 දින සිට 1973.06.30 දක්වා) පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර් පත් භාරගනු ලැබේ:—

(1) වියන ලද ජෝඩු පොල්අතු (7′ ක් දික්වූද, 14″ ක් පළල්වූද 1,000 ක මිල).
(2) අළුහුනු බුසල් ගණනින් (බුසල් 1ක් රු. 44 කට නොඅඩු බර තිබිය යුතුයි).
(3) තම්බාපු හුනු (බුසල් ගණනින්).
(4) කළුගල් 6″×9″ (කියුබ් ගණනින්).
(5) තලාපු ගල් 2″ (කියුබ් ගණනින්).
(6) තලාපු ගල් 1½″ (කියුබ් ගණනින්).
(7) තලාපු ගල් 1″ (කියුබ් ගණනින්).
(8) තලාපු ගල් ¾″ (කියුබ් ගණනින්).
(9) තලාපු ගල් ½″ (කියුබ් ගණනින්).
(10) පිළිස්සූ ගඩොල් (4½″×2¾″×8½″ ප්‍රමාණයේ 1,000ක මිල)
(11) ගඟ වැලි (කියුබ් ගණනින්).

3. ඉහත දක්වෙන ද්‍රව්‍ය වෙනුවෙන් පහත සඳහන් පරිදි මිල ගණන් දක්විය යුතුයි:—

(i) ලොරි/ට්‍රැක්ටර් ගමන් කළ හැකි ස්ථානයකදී ද්‍රව්‍ය භාරදීම් කළ යුතුයි. ද්‍රව්‍ය ප්‍රවාහනය දෙපාර්තමේන්තු වාහන මඟිනි;
(ii) ගල් පිපිරීම් සඳහා පුපුරණ ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයනු නොලැබේ;
(iii) ද්‍රව්‍ය සැපයීම් ස්ථානයේ සිට වැඩ බිමට ඇති දුර දක්විය යුතු අතර, වැඩ බිමට හැකිතරම් ආසන්නයෙන්ම ද්‍රව්‍ය සැපයීම් කළ යුතුය.

4. එක් එක් දිස්ත්‍රික්කයන් වෙනුවෙන් රුපියල් පණහක් (රු. 50 ක්) බැගින් තැන්පත් කර ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කර ටෙන්ඩර් අයදුම් පත් ලබාගත හැකිය. සියලුම තැන්පත් මුදල් මගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකි අතර, එම රිසිට්පත් ගාල්ලේ, ඉඩම් සංවර්ධන නිලධාරි කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් අයදුම්පත් ලබාගත හැකිය. ටෙන්ඩර් පත් ලබාගත හැකි අවසාන දිනය 1973 පෙබරවාරි 15 දින පෙ. ව. 11.30 තෙක් පමණක් බව සලකන්න.

5. සෑම ටෙන්ඩර් අයදුම්කරුවෙක්ම ඔහුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. දිස්ත්‍රික්ක වශයෙන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි වම් පස උඩ කෙළවරෙහි "ගාල්ල ඉඩම් සංවර්ධන කොට්ඨාශයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම් සඳහා ටෙන්ඩර් පත්" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත් කවරයක බහා සීල් තබා ඉදිරිපත් කළ යුතුයි.

"ඉඩම් සංවර්ධන නිලධාරි, ඉඩම් සංවර්ධන කාර්යාලය, නගර ශාලා ගොඩනැගිල්ල, ගාල්ල." නැතහොත් ගාල්ල ඉඩම් සංවර්ධන කාර්යාලයේ ඒ සඳහා වෙන් කරන ලද ටෙන්ඩර් තන්පත් පෙට්ටියේ තැන්පත් කළ හැක.

6. 1973 පෙබරවාරි 20 වැනි දින ප. ව. 2.30 ට ගාල්ලේ, ඉඩම් සංවර්ධන නිලධාරී විසින් එම කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. 1973 පෙබරවාරි 20 වෙනි දින ප. ව. 2 ට පසු ලැබෙන ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී යෝග්‍යයැයි සිතේ නම් ටෙන්ඩර්කරුවනට පෙනී සිටිය හැක.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඒ බව දැන්වූ විට සති දෙකක් ඇතුළත ද්‍රව්‍ය සැපයීමට හැකිවිය යුතුයි. එසේ කිරීමට නොහැකි වුවහොත් ටෙන්ඩර් ගිවිසුම් කඩ කළ කොන්ත්‍රාත්කරුවෙකු සේ සළකා ඒ අනුව කටයුතු කරනු ඇත.

8. ටෙන්ඩර් ගණනාවක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයක කොටසක් භාර ගැනීම හෝ විශේෂ විස්තරයකට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි සතුය.

කේ. අරුණසිරි,
ඉඩම් සංවර්ධක නිලධාරි, ගාල්ල.

1973 ජනවාරි 15 දින,
ගාල්ලේ ඉඩම් සංවර්ධන කාර්යාලයේ දී ය.

1-959—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පහත සඳහන් ව්‍යාපාරයන්හි වැඩ සඳහා ඒ ඒ විෂයයන් ඉදිරියෙන් සඳහන්ව ඇති ගණන්වලට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන්, පළාතේ සමුපකාර සමිතිවලින්, කම්කරු සමිතිවලින්, ග්‍රාම සංවර්ධන සමිතිවලින් සහ ගොවිකාරක සභා සමිතිවලින් අංක 545, කොළඹ පාර, ගිංතොට, නිර්මාණ ඉංජිනේරු කාර්යාලයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. 1973.01.27 සිට 1973.02.15 (දෙදිනම ඇතුළුව) දින දක්වා 545, කොළඹ පාර, ගිංතොට, වාරිමාර්ග නිර්මාණ වැඩ කොට්ඨාශයේ, නිර්මාණ ඉංජිනේරු කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුළදී ලබා ගත හැකි ටෙන්ඩර් අයදුම්පත් සකස් කර දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ෆෝරම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා නිර්මාණ ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර එම විෂයයන් ඉදිරියෙන් සඳහන්ව ඇති ගණන්වලට අනුව ටෙන්ඩර් තැන්පත් මුදල් 545, කොළඹ පාර, ගිංතොට, වාරිමාර්ග නිර්මාන වැඩ කොට්ඨාශයේ නිර්මාන ඉංජිනේරුගේ කාර්යාලයේ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය 1973.2.15 දින හෝ ඊට පෙර කාර්යාලයීය වේලාවන් තුළදී ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් අයදුම්පත් සීල් තබා වැසූ ලියුම් කවරයක බහා එහි වම් කොනේ ඒ ඒ වැඩයේ නම සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් එවා හෝ 545, කොළඹ පාර, ගිංතොට, වාරිමාර්ග නිර්මාන ඉංජිනේරු කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. 1973.02.16 දින දහවල් 12 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර කොන්ත්‍රාත්කරු හෝ ඔහුගේ නියෝජිතයෙක් ඒ වේලාවේ පැමිණිය යුතුය. තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු විසින් අනුමත ලිපිය ලැබී සතියකින් වැඩ පටන්ගත යුතුය. එම ටෙන්ඩර්කරු විසින් නියමිත කාලය තුළදී වැඩ නිමකිරීමට අපොහොසත් වූ විට රජයේ කොන්ත්‍රාත් කඩකළ ලැයිස්තුවට ඇතුලත් කිරීමට අවකාශ ඇත.

| අංකය | වැඩෙහි නම | ලියාපදිංචි මුදල රු. | ශ. | තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| 1 | පටන් ගැන්මේ සිට දම්වැල් 18.5 දක්වා නුපේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 70,000 | 0 | 100 | 0 |
| 2 | දම්වැල් 18.5 සිට දම්වැල් 26 දක්වා නුපේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 1,00,000 | 0 | 100 | 0 |
| 3 | දම්වැල් 26 සිට දම්වැල් 32 දක්වා නුපේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 1,00,000 | 0 | 100 | 0 |
| 4 | දම්වැල් 32 සිට දම්වැල් 38 දක්වා නුපේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 1,00,000 | 0 | 100 | 0 |
| 5 | දම්වැල් 38 සිට දම්වැල් 47 දක්වා නුපේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 1,00,000 | 0 | 100 | 0 |
| 6 | දම්වැල් 47 සිට සැතපුම් 1 දම්වැල් 2 දක්වා නුපේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 1,00,000 | 0 | 100 | 0 |
| 7 | සැතපුම් 1 දම්වැල් 2 සිට සැතපුම් 1 දම්වැල් 7.5 දක්වා නුපේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 85,000 | 0 | 100 | 0 |
| 8 | සැතපුම් 1 දම්වැල් 7.5 සිට සැතපුම් 1 දම්වැල් 28 දක්වා නුපේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 60,000 | 0 | 100 | 0 |
| 9 | නුපේ ඇල හරහා කාලිදාස පාරේ පාලමක් තැනීම | 20,000 | 0 | 25 | 0 |
| 10 | රංගළු ඇලේ වම් ඉවුරේ දම්වැල් 35.6 පාලකයක් තැනීම | 20,000 | 0 | 25 | 0 |
| 11 | රංගළු ඇලේ දකුණු ඉවුරේ දම්වැල් 9.5 පාලකයක් තැනීම | 20,000 | 0 | 25 | 0 |
| 12 | රංගළු ඇලේ දකුණු ඉවුරේ දම්වැල් 46.6 පාලකයක් තැනීම | 20,000 | 0 | 25 | 0 |
| 13 | කුලීමඩ ඇලේ සැතපුම් 1 දම්වැල් 13.9 පාලකයක් තැනීම | 70,000 | 0 | 100 | 0 |
| 14 | ලංකා ඇලේ දම්වැල් 2 හි පාලකයක් තැනීම | 25,000 | 0 | 25 | 0 |
| 15 | ලංකා ඇලේ සැතපුම් 1 දම්වැල් 38.5 පාලකයක් තැනීම | 30,000 | 0 | 50 | 0 |

කේ. ඩී. ඒ. එච්. නානායක්කාර,
නිර්මාන ඉංජිනේරු,
ගාල්ල නිර්මාන වැඩ කොට්ඨාශය.

1973 ජනවාරි 10 වැනි දින,
ගිංතොට, ගාල්ල නිර්මාන වැඩ කොට්ඨාශය.
කාර්යාලයේ දීය.

1-956—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම්

### ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

අවසාන තීරණය

| සේවයේ ස්වභාවය | අවසාන දිනය | ටෙන්ඩර් කරුවන් | පිළිගත් ගාස්තුව | ටෙන්ඩරය ලබාගත් සමාගම |
|---|---|---|---|---|
| ඩීසල් හයිඩ්‍රෝලික් මැදිරි හතරේ බලවේග දුම්රිය දහයක් (10) සැපයීම සඳහා ටෙන්ඩරය | 1972.4.29 | 8 | ලංකා රු. 2,72,00,900 මිල සහ නැව් ගාස්තු | සීමාසහිත සී. ඉටෝ සහ සමාගම, 4, 2–චෝම්, හොන්–චෝ, නිහොන් බාෂි, චියු–කෝ, ටෝකියෝ, ජපානය |

1-949—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම්

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

හොරණ රජයේ ගොවිපලේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හොරණ රජයේ ගොවිපලට අයත් ප්‍රයෝජනයට ගතනොහැකි භාණ්ඩ 1973 ජනවාරි මස 30 දින පෙ. ව. 10 ට ඉහත සඳහන් ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසිවූ මොහොතේම සම්පූර්ණ මුදල් ගෙවිය යුතු අතර වෙන්දේසිය පැවැත්වෙන දින ප. ව. 3.30 ට පෙර සියලුම භාණ්ඩ ගැණුම්කරුවන් විසින් ඉවත් කර ගත යුතුය.

3. වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ ලේඛණයක් මෙම කාර්යාලයේ හා එම ගොවිපලේ දැන්වීම් පුවරුවල ප්‍රසිද්ධ කරනු ලැබේ.

4. මෙම භාණ්ඩ වෙන්දේසිය පැවැත්වෙන දිනට පෙර දිනවලදී කාර්යාල වේලාවන් තුළදී ඉහත සඳහන් ගොවිපලේදී පරීක්ෂා කර බැලිය හැක.

පරිපාලක නිලධාරී (ගො. පා. හා නි.),
කොළඹ.

ගොවිපලේ පාලන හා නිෂ්පාදන කාර්යාලය,
තැ. පෙ. 622, පළතුරු කම්හල පාර, නාරාහේන්පිට,
කොළඹ 5, 1973 ජනවාරි 01.

1-861—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

අංකය : මඋපා 14/71

## පානදුර මහේස්ත්‍රාත් උසාවිය—බයිසිකල් හා අනිකුත් භාණ්ඩ වෙන්දේසිය

මෙම උසාවියේ නිශ්චිත නඩු වල පහත විස්තර සඳහන් බයිසිකල් හා අනිකුත් භාණ්ඩ 1973 පෙබරවාරි මස 24 වෙනි දින පස්වරු 1.30ට පානදුර මහේස්ත්‍රාත් උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බැව් මෙයින් දනුම් දෙමි.

වෙන්දේසිය අවසන්වූ වහාම ලන්සු තබන්නන් විසින් වටිනාකම මුදලින් ගෙවා බයිසිකල් හා අනිකුත් භාණ්ඩ උසාවි භූමියෙන් ඉවතට ගෙන යා යුතුය.

පූ. බ. රඹුක්වැල්ල,
පානදුරේ මහේස්ත්‍රාත්.

1973 ජනවාරි මස 06 දින,
පානදුරේ මහේස්ත්‍රාත් උසාවියේ දී ය.

| | නඩුඅංකය | | භාණ්ඩ විස්තර |
|---|---|---|---|
| 1. | ඒආර් 586/69 | ... | අංකය බීඑස් 41338 බයිසිකලය |
| 2. | අංකය සොයා ගැනීමට නො හැක. | | ,, ඒවයි 16536 ,, |
| 3. | ඒආර් 300/70 | ... | ,, එක්ස් ඊ 10329 ,, |
| 4. | ඒආර් 225/71 | ... | ,, ටීබී 37322 ,, |
| 5. | ඒආර් 1328/70 | ... | ,, සීකේ 34572 ,, |
| 6. | ඒආර් 1998/71 | ... | ,, එස් 00460 ,, |
| 7. | ඒආර් 1329/70 | ... | ,, ජීඑල් 314 ,, |
| 8. | ඒආර් 955/68 | ... | ,, ජේවයි 1992 ,, |
| 9. | ඒආර් 136/70 | ... | ,, ඒකේ 65430 ,, |
| 10. | ඒආර් 653/68 | ... | ,, ඩීඑල් 63836 ,, |
| 11. | ඒආර් 40/67 | ... | අංකය පැහැදිලි නැත. ,, |
| 12. | 19259 | ... | ,, ඒඑජ් 25379 ,, |
| 13. | — | ... | ,, ඩී 44994 ,, |
| 14. | 14613 | ... | ,, එස් 56092 ,, |
| 15. | 14613 | ... | ,, ටීඑජ් 35 ,, |
| 16. | 12745 | ... | ,, සීකේ 2194 ,, |
| 17. | 12313 | ... | ,, ඒඑච් 4399 බයිසිකලය |
| 18. | 387 | ... | ,, බීට් 18461 ,, |
| 19. | 18136 | ... | ,, ඒට් 259 ,, |
| 20. | 99707 | ... | ,, ඩීඑන් 80013 ,, |
| 21. | ඒආර් 2413/72 | ... | බයිසිකල් හැඬල් 9යි, චේන් කවර 6යි, දම්වැල් 13යි, ඉදිරිපස පෝක් 2යි, පිටුපස පෝක් 3යි, හනිමු සීට 7යි, බයිසිකල් ස්ටෑන්ඩ 3යි, බයිසිකල් ලාම්පු කොකු 6යි, බයිසිකල් සීනු 3යි, බයිසිකල් ලාම්පු 3යි, බයිසිකල් ටයර් 5යි, ටියුබ 10යි, හැඬල් ඇණ 4යි, ඇක්සල් 8යි, ප්‍රීවිල් 9යි, හබ 1යි, හබ් බ්‍රේක් 1යි, සීට පොලු 4 යි, බ්‍රේක් කම්බි 17යි, බ්‍රේක් ආම්ස් 7යි, කොග්විල් 4යි, පැඩල් කෝම්ස් 4යි, මඩගාඩ 6යි, රිම් 4යි, මඩ ගාඩ් කූරු ජෝඩු 20යි, බ්‍රේක් පලු 22යි, ලගේජ් කැරියර් 1යි, ප්‍රේම් කැලි 22 යි. බයිසිකල් අගුල් 6 යි. |
| 22. | බීආර් 1461/71 | ... | අත් ඔරලෝසු 1යි |
| 23. | 21476 | ... | වේග මාපක යන්ත්‍රයක් |
| 24. | ඒආර් 147/68 | ... | ටයිම්පීස් ඔරලෝසු 1යි, |
| 25. | 2793 | ... | එම |
| 26. | ජේ. 1932 | ... | එම |
| 27. | ඒආර් 145/69 | ... | ඇළුමිණියම් කැටි 9 යි |
| 28. | — | ... | කුඩා පිත්තල පඩික්කං 1යි |
| 29. | ඒආර් 15/69 | ... | වෝක්ස්වාගන් හබ කප් 1යි |
| 30. | 95337 | ... | හෙඩ් ලැම්ප් බීම් 1යි |
| 31. | 10510 | ... | ටේබල් ෆෑන් 1යි |
| 32. | 20030 | ... | බස්රියක රේඩියේටර් 1යි |
| 33. | — | ... | බෝතල් මූඩි ගැසීමේ යන්ත්‍ර 1යි |

1–931—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ වෙන්දේසිය—ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය, කොළඹ

පහත සඳහන් භාණ්ඩ 1973 පෙබරවාරි මස 10 වන දින ප. ව. 12.30 ට මෙම උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලබන බැව් මහජනයාට මෙයින් දනුම් දෙමි. එම භාණ්ඩ එදින දවල් 12.00 ට බැලීමට හැකිවේ. ගැණුම් කරුවන් විසින් මුදලින් ගෙවීම කළයුතු අතර, ඒ දිනම භාණ්ඩ ඉවත් කර ගත යුතුයි.

| නඩු අංක | | භාණ්ඩ විස්තර |
|---|---|---|
| | | පා පැදි සහ පා පැදි ප්‍රේම් |
| පී 749 | ... | බී 23 බී |
| පී 751 | ... | ඒ 55083 |
| පී 752 | ... | 71 ජේ 714 |
| පී 758 | ... | සී.ජේ. 1444 |
| පී 759 | ... | ඩී.ඇල්. 43815 |
| පී 761 | ... | එෆ්.එස්. 9750 |
| පී 762 | ... | ඒ.ආර්. 94186 |
| පී 765 | ... | ඩී.සී. 83772 |
| පී 772 | ... | ඒ.ඇන්. 43061 |
| ,, | ... | බී.වී. 89372 |
| ,, | ... | බී.ඒ. 99102 |
| ,, | ... | 69 එල් 87 |
| ,, | ... | ඒ.ඩී. 4692 |
| ,, | ... | ඒ.වී. 35511 |
| ,, | ... | ඊ.ඩබ්. 808 |
| ,, | ... | සී.ඔ. 2014 |
| ,, | ... | සී.වී. 414 |
| ,, | ... | 68 ජේ. 1435 |
| ,, | ... | එෆ්. එෆ්. 1129 |
| ,, | ... | සී.වී. 10264 |
| ,, | ... | ඩී.එන්. 77443 |
| ,, | ... | එ.එෆ්. 74923 |
| ,, | ... | වී.ඒ. 668 |
| ,, | ... | එක්ස්.යූ. 943 |
| ,, | ... | — 8607 |
| 46231/සී | ... | ඩී.ඩබ්. 62 බී.එස්.ඒ. |

| නඩු අංකය | | භාණ්ඩ විස්තර |
|---|---|---|
| | | අනිකුත් භාණ්ඩ |
| 24154/ඒ | ... | සූට්කේස් එකක් |
| — | ... | පිහන් 12 |
| 48285/ඒ | ... | පිත්තල ඇණ පෙට්ටියක් |
| 12345/බී | ... | ගුවන් විදුලි යන්ත්‍රයක් (වැලිෆන්කන්) |
| 50321/ඒ | ... | අත් ඔර්ලෝසුවක් |
| 53173/බී | ... | අත් ඔර්ලෝසුවක් |
| පී 747 | ... | ගුවන් විදුලි යන්ත්‍රයක් (ට්‍රාන්සිස්ටර් ආර් 804) |
| පී 748 | ... | රිම් එක සහිත කාර් ටයරයක් |
| පී 755 | ... | වැල්ඩින් බැරල් එකක් |
| පී 756 | ... | රිම් එක සහිත ලොරි ටයර් එකක් |
| පී 764 | ... | පාපැදි ආයුධ පෙට්ටියක් |
| පී 770 | ... | සපත්තු අඩි සඳහා රබර් සෝල්ඩ 4 ක් |
| පී 771 | ... | කාර් ජැක් එකක්<br>හබ කැප් එකක්<br>පැට්රෝල් කප් 3ක් |
| 45510/සී | ... | සයිකල් කොටස් |
| 51374/සී | ... | කුඩයක් |
| 29779/ඒ | ... | පයිප කැලි 13ක් |

මෙයට අමතර භාණ්ඩ ඇතොත් ඒ සඳහා ලැයිස්තු විකිණීමේ දිනට පෙර දින, මෙම කායර්‍යාලයේ දී බැලිය හැක.

ඩී. ඊ. ධර්මසේකර,
කොළඹ, ප්‍රධාන මහෙස්ත්‍රාත්.

1973 ජනවාරි මස 10 වෙනි දින,
කොළඹ, ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

1–854—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා, නාවික ඩීසල් එන්ජින්, ධීවර ආම්පන්න සහ පිටත සවිකරන එන්ජින් වෙන්දේසියේ විකිණීම්

පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා, නාවික ඩීසල් එන්ජින් ධීවර ආම්පන්න සහ පිටත සවිකරන යන්ත්‍ර පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන දිනයන්හිදී එම ස්ථානවලදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. උපලේඛනයෙහි සඳහන් ස්ථානයන්හි දී මෙම යාත්‍රා, එන්ජින් ධීවර ආම්පන්න සහ යන්ත්‍ර පරීක්ෂා කර බැලිය හැකිය.

3. ගෙවීම් පහත සඳහන් පරිදි මුදලින්ම කළ යුතුය :—

(අ) යාත්‍රාවේ/එන්ජිමේ/ධීවර ආම්පන්නවල විකුණුම් මිලෙන් $\frac{1}{4}$ ක් විකිණීම අවසන් වූ වහාම.

(ආ) විකුණුම් මිලෙන් ඉතිරි $\frac{3}{4}$ කොටස දින 3ක් ඇතුළතදී.

(ඇ) කෙසේ වුවද යම් යාත්‍රාවක්/එන්ජිමක්/ධීවර ආම්පන්න ආදියක් වෙනුවෙන් යමෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවක් තාවකාලික වශයෙන් පිළිගැනීමට ඉඩ තිබේ. එම ලංසුව අවසාන වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ දින 14ක කාලයකට සීමා කරනු ලැබේ. එවැනි අවස්ථාවලදී යාත්‍රාවේ/එන්ජිමේ/ධීවර ආම්පන්නවල විකුණුම් මිලෙන් $\frac{1}{4}$ ක් තැන්පත් මුදලක් වෙන්දේසිය අවසානවූ වහාම ගෙවිය යුතුය. එම ලංසුව පිළිගනු ලැබුවහොත් විකුණුම් මිලෙන් ඉතිරි $\frac{3}{4}$ ක මුදල අවසාන පිළිගැනීමේ දැන්වීම ඒවා දින 3ක් ඇතුළත ගෙවිය යුතුය. මෙම මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ තැන්පත් මුදල අහිමි වීමයි. ලංසුව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

4. පිටත සවිකරණ යන්ත්‍ර සම්බන්ධයෙන් ජයග්‍රාහී ඉල්ලුම් කරුවන් විසින් එම අවස්ථාවේදීම ඉල්ලුම් කළ මුදලින් $\frac{1}{4}$ ක් ගෙවා, ඉතිරි මුදල පසුදින දහවල් 12.00 ට ප්‍රථම ගෙවිය යුතුයි.

5. වෙන්දේසියේ විකුණන ලද යාත්‍රා, එන්ජින් සහ ධීවර ආම්පන්න මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමිභාගයෙහි තිබෙන්නට හරිනු ලැබේ.

### උප ලේඛණය

#### යාපනය-දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශය

| යාත්‍රා කඳන් යාත්‍රා අංකය | එන්ජින් වර්ගය | වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය | වේලාව |
|---|---|---|---|---|
| එස්අයිසී—130 | ටෝර්පිඩෝ (බ්ලොක් එක පමණයි) | කරෙයිනගර් | 1973.02.24 | පෙ.ව. 10.00 |
| එන්.එල්. 51 | — | පවර්ක්‍රාප්ට් යාත්‍රාංගනය යාපනය) | 1973.02.26 | පෙ.ව. 10.00 |
| එස්අයිසී 84 | ටෝර්පිඩෝ | එම | 1973.02.26 | පෙ.ව. 10.00 |
| එම්සී 83 | — | එම | 1973.02.26 | පෙ.ව. 10.00 |
| ටී. 136 | — | එම | 1973.02.26 | පෙ.ව. 10.00 |
| එස්. 270 | — | කන්කසකතුරේ වෙරළ | 1973.02.20 | ප.ව. 2.00 |
| එන්.එල්. 37 | — | පේද්‍රුරුතුඩුව | 1973.02.22 | පෙ.ව. 9.00 |
| ටී.එස්. 51 | — | කරකොප්පු | 1973.02.22 | පෙ.ව. 11.00 |
| එම්.සී. 30 | — | වේලානෙයි | 1973.02.23 | පෙ.ව. 10.00 |

**එන්ජින් :**

| | | | | |
|---|---|---|---|---|
| ටීඑස්. 61 | පර්කින්ස් (එන්ජිමේ කොටස්) | පේද්‍රුරුතුඩුව ධීවර කාර්යාලය | 1973.02.22 | ප.ව. 2.00 |

**පිටත සවි කරණ යන්ත්‍ර :**

පිටත සවිකරන යන්ත්‍රයේ අංකය හා වර්ගය

| | | | | |
|---|---|---|---|---|
| 2333 | මැක්ලොඩ්ස්කොට් | කාලයාඩි ධීවර කාර්යාලය | 1973.02.19 | පෙ.ව. 10.30 |
| 1634194 | මර්කරි | කන්කසන්තුරේ ධීවර කාර්යාලය | 1973.02.20 | පෙ.ව. 10.30 |

#### මන්නාරම—දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශය

**යාත්‍රා කඳන් :**

| | | | | |
|---|---|---|---|---|
| එෆ්—23 | — | ඉරුකුලම්පිඩි | 1973.02.26 | පෙ.ව. 10.00 |

#### මුලතිව්—දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශය

**එන්ජින් :**

| | | | | |
|---|---|---|---|---|
| එස්අයිසී—102 | ටෝර්පිඩෝ | මුලතිව්, දිස්ත්‍රික් ධීවර කාර්යාලය | 1973.03.01 | පෙ.ව. 10.00 |

#### මඩකලපුව—දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශය

**යාත්‍රා කඳන් :**

| | | | | |
|---|---|---|---|---|
| ටී. 322 | — | පුන්නෙයිකුඩා | 1973.02.20 | පෙ.ව. 10.30 |
| එස්.අයි. සී. 101 | ටෝර්පිඩෝ | වාලච්චේනෙයි ධීවර කාර්යාලය | 1973.02.21 | පෙ.ව. 10.00 |

**ධීවර ආම්පන්න :**

| | | | | |
|---|---|---|---|---|
| ජීඔඩීබී 6.4$\frac{1}{2}$″ | නයිලෝන් දැල් 372 × 9 යාර | මඩකලපුව දිස්ත්‍රික් ධීවර කාර්යාලය | 1973.02.22 | පෙ.ව. 11.30 |
| 5″ | නයිලෝන් දැල් 45 × 9 යාර | | | |
| 4″ | නයිලෝන් දැල් 63 × 9 යාර | | | |
| 3$\frac{1}{2}$″ | නයිලෝන් දැල් 87 × 9 යාර | | | |
| — | ලී ඉපිලි 20 | | | |
| | පාවිච්චි කල නොහැකි ඉරි | | | |
| — | ගියදැල් කැබලි | | | |

**පිටක සවිකරන යන්ත්‍ර :**

පිටක සවිකරණ යන්ත්‍ර අංකය හා වර්ගය :

| | | | | |
|---|---|---|---|---|
| 2502530 | පෙන්ටා | දිස්ත්‍රික් ධීවර කාර්යාලය, මඩකලපුව | 1973.02.19 | පෙ.ව. 10.00 |
| 2502547 | පෙන්ටා | | | |
| 1902448 | පෙන්ටා | | | |
| ටී.එච්.සී. 80222එල් | සී-ගල් | | | |

### ත්‍රිකුණාමලය—දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශය

| යාත්‍රා කඳන් යාත්‍රා අංකය | එන්ජින් වර්ගය | වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය | වේලාව |
|---|---|---|---|---|
| **යාත්‍රා කඳන් :** | | | | |
| එල්—19 | — | ඇතුල් වරාය, ත්‍රිකුණාමලය, දිස්ත්‍රික් ධීවර කාර්යාලය අසල | 1973. 02.17 | පෙ.ව. 10.00 |
| එස්.අයි.සී 139 | ටෝර්පිඩෝ | ගංගා | 1973. 02.19 | පෙ.ව. 10.00 |
| එම්ජේඩී 30 | — | කුල්ලවාඩි | 1973. 02.20 | පෙ.ව. 10.00 |
| **එන්ජින් :** | | | | |
| එස්—8. | බුක් | ත්‍රිකුණාමලය, දිස්ත්‍රික් ධීවර කාර්යාලය | 1973. 02.17 | ප.ව. 2.00 |
| එල්. 19 | බුක් | එම | | |

### කල්මුණේ—දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශය

| | | | | |
|---|---|---|---|---|
| එස්.—92 | යන්මාර් | ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය, අම්පාරේ | 1973. 02.19 | පෙ.ව. 11.00 |

### පුත්තලම—දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශය

| | | | | |
|---|---|---|---|---|
| **යාත්‍රා කඳන් :** | | | | |
| ටී—152 | — | ජෙටි වීදිය, හලාවත | 1973. 02.14 | පෙ.ව. 10.00 |
| ටී—433 | පර්කින්ස් | එම (කොටස් පමණයි) | | |
| එස්අයිසී 103 | — | නාඩුපාඩු වෙරළ, හලාවත | 1973. 02.15 | පෙ.ව. 10.00 |
| ඩබ්.එස්. 50 | — | ඉරණවිල ගංගා මෝය | 1973. 02.17 | පෙ.ව. 10.00 |
| **එන්ජින්** | | | | |
| ටී 253 | පාර්සන්ස් | හලාවත, ධීවර කාර්යාලය | 1973. 02.14 | පෙ.ව. 11.00 |
| එස්.අයිසී 142 | ටෝර්පිඩෝ | එම | | |
| ඩබ්.එස්. 50 | පර්කින්ස් | නීතා ස්ටෝර්ස්, තොඩුවාව | 1973. 02.14 | ප.ව. 2.00 |
| **පිටත සවිකරන යන්ත්‍ර** | | | | |
| **පිටත සවිකරන යන්ත්‍ර අංකය හා වර්ගය :** | | | | |
| 2080211 | මර්කරි | කටුනේරිය ධීවර කාර්යාලය | 1973. 02.28 | පෙ.ව. 10.30 |
| 2080280 | මර්කරි | හලාවත, ධීවර කාර්යාලය | 1973. 02.23 | පෙ.ව. 10.30 |
| 1698505 | මර්කරි | කල්පිටිය, ධීවර කාර්යාලය | 1973. 02.27 | පෙ.ව.10.30 |

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

1973 ජනවාරි 12 වැනි දින,
කොළඹ 3, ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

1-872—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

### නොතාරිස් දැන්වීමයි

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ රුවන්වැල්ලේ යටන්වල පදිංචි සවර්ණා පද්මිණී ජයසිංහ වන මම 1907 අංක 1 දරණ නොතාරිස් ආඥපනතෙහි 7 වෙනි වගන්තිය යටතේ පළමුවන උපලේඛණයෙහි නොතාරිස්වරුන් ඇතුළත් කර ගැනීමේ නියෝග ප්‍රකාර අද පටන් මාසයක් ගතවූ විට නොතාරිස්වරුන් පිළිබඳ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට හා සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු ලෙස ඇතුළත් කර ගැනීමට අවසර ලබා ගැනීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ජනරජයට හා මහජනයාට මෙයින් දැනුම් දෙමි.

මෙයට

එස්. පී. ජයසිංහ.

73.1.17.

1-983—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙර කෙරෙන නීත්‍යානුගත දැන්වීමයි

කළුතර උතුරේ විලේගොඩ විවේකාරාම පාරේ අංක 158හි පදිංචි විල්බට් සිල්වා අසුරමුනි වන මම අද සිට පුරාමසක් ගතවූ පසු කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන මෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. ඇස්. අසුරමුනි.

1973 ජනවාරි 11 වැනි දින.

1-983—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

උඩහමුල්ලේ අංක 436 දරණ නිවසෙහි පදිංචි ප්‍රතිඥත ලිපිකරු පී. බියන්විල වන මම ඉදිරියට පැවැත්වෙන සිංහල නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටින බව මෙයින් දැනුම් දෙමි.

පී. බියන්විල.

1973.1.12.

1-1007—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී: සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ජනවාරි ... | 73. 1. 5 | සිකුරාද ... | 72.12.27 | බදාදා | දවල් 12.00 |
| | 73. 1.12 | සිකුරාද ... | 73. 1. 3 | බදාදා | දවල් 12.00 |
| | 73. 1.19 | සිකුරාද ... | 73. 1.10 | බදාදා | දවල් 12.00 |
| | 73. 1.26 | සිකුරාද ... | 73. 1.17 | බදාදා | දවල් 12.00 |
| පෙබරවාරි ... | 73. 2. 2 | සිකුරාද ... | 73. 1.24 | බදාදා | දවල් 12.00 |
| | 73. 2. 9 | සිකුරාද ... | 73. 1.31 | බදාදා | දවල් 12.00 |
| | 73. 2.15 | බ්‍රහස්පතින්දා... | 73. 2. 7 | බදාදා | දවල් 12.00 |
| | 73. 2.23 | සිකුරාද ... | 73. 2.14 | බදාදා | දවල් 12.00 |
| මාර්තු ... | 73. 3. 2 | සිකුරාද ... | 73. 2.21 | බදාදා | දවල් 12.00 |
| | 73. 3. 9 | සිකුරාද ... | 73. 2.28 | බදාදා | දවල් 12.00 |
| | 73. 3.16 | සිකුරාද ... | 73. 3. 7 | බදාදා | දවල් 12.00 |
| | 73. 3.23 | සිකුරාද ... | 73. 3.14 | බදාදා | දවල් 12.00 |
| | 73. 3.30 | සිකුරාද ... | 73. 3.21 | බදාදා | දවල් 12.00 |
| අප්‍රේල් ... | 73. 4. 4 | සිකුරාද ... | 73. 3.28 | බදාදා | දවල් 12.00 |
| | 73. 4.11 | බදාදා ... | 73. 4. 4 | බදාදා | දවල් 12.00 |
| | 73. 4.19 | බ්‍රහස්පතින්දා... | 73. 4.11 | බදාදා | දවල් 12.00 |
| | 73. 4.27 | සිකුරාද ... | 73. 4.18 | බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. ජී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.